දෛවඥකාමධේනු: දඹදෙණි සංස්කෘත සාහිත්‍යයේ උත්කෘෂ්ඨ ලාංඡනය

The Daivajñakāmadhenu: The paramount symbol of Sanskrit literature in Damdeniya era

ආචාර්ය ජම්බුගහපිටියේ ධම්මාලෝක හිමි

Abstract

The Daivajñakāmadhenu, an astrological treatise composed by Most Venerable Anavamadarśī in the Dambadeniya era is a unique text among the Sanskrit treatises written in Sri Lanka. Given the content and the voluminÈity of the text, it is an indispensable in any historical or scientific account of the Sanskrit literature in Sri Lanka. This paper intends to highlight the significance of the Daivajñakāmadhenu in the corpus of Sanskrit literature in Sri Lanka and in particular, in the Dambadeniya era. To that end, the history of Sanskrit literature form Anuradhapura era to Dambadeniya era is briefed at the outset of the paper and then, the Sanskrit literature in Dambadeniya era and the Daivajñakāmadhenu are discussed extensively.

ප්‍රමුඛ පද: දෛවඥකාමධේනු, අනවමදර්ශී, ජ්‍යෝතිෂය, දඹදෙණි යුගය, හත්ථවනගල්ල විහාරය

1. හැඳින්වීම

වාස්තවික මූලාශ්‍රයයන් සහිත ලොව ඉපැරණි සාහිත්‍යයන් අතුරින් සංස්කෘත සාහිත්‍යයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. යටත් පිරිසෙයින් ක්‍රි.පූ. තුන්වන සහශ්‍රකයේ දී පමණවත් නිර්මාණය වන්නට ඇතැ යි අනුමාන කෙරෙන ඍග්වේදයෙන්

ඇරඹෙන මෙම සාහිත්‍යාවලිය විවිධ වෛෂයික ශානරයන් ඔස්සේ ශාඛා-ප්‍රශාඛා බිහි කරමින් විකාසනය වී තිබේ. මෙම සාහිත්‍ය වංශයේ ආනුභාවය පුරාණයේ සිට ම භාරත දේශයට හෝ හුදෙක් ඉන්දියානු උපමහද්වීපයට පමණක් සීමා වූවා නො ව ඉන් එපිට තදාසන්න රාජ්‍යයන් සහ සංස්කෘතීන් වෙත ද අනවරත බලපෑමක් කළ බැව් සුළු විමසුම් ඇසකට වුව ද පසක් වේ. එය බටහිර දෙසින් මධ්‍ය ආසියාව දක්වාත් පෙරදිගින් ඈත පෙරදිග දක්වාත් අග්නිදිග ආසියානු කලාපයටත් විහිද ගොස් ඇති අතර ඊට දකුණින් භාරත භූ ඛණ්ඩයට සමාසන්න ව පිහිටි ශ්‍රී ලංකාවට ද නො මඳ ව බලපා තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් පුරාණයේ සිට ම ලක්වැසියා ද සංස්කෘත භාෂාව භාවිත කිරීමටත් සංස්කෘත සාහිත්‍යය පරිශීලනය කිරීමටත් පෙළඹුණු බැව් දක්නට ලැබේ.

2. ලංකා සංස්කෘත සාහිත්‍යයේ සංක්ෂිප්ත ඉතිහාසයඃ ආරම්භයේ සිට දඹදෙණි යුගය දක්වා

ප්‍රාග්මහින්ද යුගයේ ලංකාවේ සංස්කෘත භාවිතය සම්බන්ධයෙන් අපට ඍජු සාක්ෂ්‍ය නො ලැබුණ ද ලක්දිව බ්‍රාහ්මණයන්ගේ විසීම හා ඔවුන් විසින් අධ්‍යාපන කටයුතුවල යෙදෙනු ලැබීම, වේදය පිළිබඳ ඔවුන්ගේ දැනුම, බ්‍රාහ්මණයන් පුරෝහිතයන් වශයෙන් පුරාණ රජවරුන්ට සේවය කිරීම ආදිය පිළිබඳ ව මහාවංසාගත තොරතුරුවලින් අනුරාධපුර යුගයේ මුල් යුගයේ පටන් ම සංස්කෘත භාෂාව ලක්දිව භාවිත වූ බැව් අනුමාන කළ හැකි ය. මහින්දාගමනයට පෙර පටන් පැවති මෙම බ්‍රාහ්මණ බලය මහින්දාගමනයෙන් පසු ව ද බලපවත්වා තිබේ (කැකුළාවල, 1965, පි.206; චන්ද්‍රවිමල හිමි, 2012, පි.43; සේනානායක, 1998, පි.34; Pannasara Sthavira, (no date), pp.11-15). එහෙත් සංස්කෘත භාවිතය සහ එහි ව්‍යාප්තිය පිළිබඳ සැලකිය යුතු සාධක හමුවන්නේ බෞද්ධ නිකායාන්තරික මතවාද ලක්දිව ප්‍රචලිත වීමත් සමඟ ය. පුරාණ ලංකාවේ බෞද්ධ මූලස්ථානය වූ මහාවිහාරය ථේරවාදය ගුරු කොට ගත් අතර ක්‍රි.පූ. පළමුවන සියවසේ දී බිහිවූ අභයගිරිය මහායාන සම්ප්‍රදායට විවෘත වූවක් විය. මේ හේතුව නිසා අභයගිරිය මුල්කරගෙන සංස්කෘතය

ලක්දිව ව්‍යාප්ත වූ බැව් මූලාශ්‍රයාගත තොරතුරුවලින් සනාථ වේ. වෝහාරිකතිස්ස රජු දවස (ක්‍රි.ව. 3 සියවස) (මහාවංසො, 1959, 36.41) සහ සිලාකාල රජු දවස (ක්‍රි.ව. 6 සියවස) (මහාවංසො, 1959, 40.37-40) වෛතුල්‍යවාදය ලක්දිව පැතිරීම වැනි තොරතුරු මෙහිලා හමුවන වැදගත් ම සාක්ෂ්‍ය වශයෙන් සඳහන් කළ හැකි ය. අභයගිරිවාසීහු මෙන් ම ජේතවනාරාම වැසි ධර්මරුචිකයෝ ද දක්ඛිණගිරි වෙහෙර වැසි සාගලිකයෝ ද හුදෙක් මහායාන දාර්ශනික කෘති පමණක් නො ව සංස්කෘත හැදෑරීම සඳහා කාව්‍ය නාටකාදි අනෙකුත් ලෞකික ශාස්ත්‍රත් හදාරන්නට ඇත (කැකුළාවල, 1965 පි.207). බුද්ධඝෝෂ හිමියන් විසින් ස්වකීය පපඤ්චසූදනීයේ සම්මාදිට්ඨි සූත්‍ර විවරණයේ දී සම්පප්‍රලාපය විවරණය කරමින් රාමසීතාදි කථා කීම සහ ඇසීම ද ඊට අයත් වන බව දක්වා තිබීම එහිලා කදිම සාක්ෂ්‍යයකි (පපඤ්චසූදනී, 2014, පි.181). එමෙන් ම මඤ්ජුශ්‍රීභාෂිත වාස්තුවිද්‍යාශාස්ත්‍රය වැනි තාක්ෂණික ග්‍රන්ථ ද සංස්කෘත භාෂාවෙන් මේ යුගයේ රචනා වී තිබේ. ඒ අනුව මෙම යුගය වන විට එනම් ක්‍රි.ව. 5-7 සියවස වන විට සංස්කෘත භාෂා ශාස්ත්‍ර භාවිතය ලංකාවෙහි ශීඝ්‍ර දියුණුවක් ලබා තිබූ බව සැලකීම යුක්ති යුක්ත ය (චන්ද්විමල හිමි, 2012. පි.43).

ඉහත දක්වන ලද කරුණුවලට අමතර ව ලක්දිව සංස්කෘත භාවිතය සම්බන්ධයෙන් තවත් බොහෝ සාහිත්‍ය සාධක සහ පුරාවිද්‍යාත්මක සාධක ඉදිරිපත් කළ හැකි ය. ඒ අතර අභිලේඛන (සෙල්ලිපි සහ ලෝහ පත්), සහ සාහිත්‍ය කෘති විශාල ප්‍රමාණයකි. එමෙන් ම සංස්කෘත කෘති පිළිබඳ ව කෙරෙන නාමික සඳහන් කිරීම් ගණනාවක් ද අපට අනෙකුත් කෘතිවල හමුවේ. අනුරාධපුර යුගයේ සිට පොළොන්නරු යුගයේ අවසානය දක්වා හමුවන එම සාධක අපට පහත දැක්වෙන පරිදි පෙළගැස්විය හැකි ය.

- අඥාතකර්තෘක කුච්චවේලි ගිරි ලිපිය (EZ. Vol.III, pp.158ff) (ක්‍රි.ව. 5-8 සියවස) - ස්තූපයක රේඛා චිත්‍රයකින් ද යුක්ත මෙම ලිපිය දක්ෂිණ භාරතීය ග්‍රන්ථ අක්ෂරමාලාවට සමීප අක්ෂර විශේෂයකින් රචනා කර තිබේ. කිසිවකු

විසින් කරන ලද පුණ්‍ය කර්මයක් අනුනට ද අනුමෝදන් කරවීමේ අභිප්‍රායෙන් මෙම ලිපිය ලියා තිබේ.

- අඥාතකර්තෘක තිරියාය සෙල්ලිපිය (EZ. Vol.IV, pp.151ff) (ක්‍රි.ව. 7-8 සියවස) - කාව්‍යමය ගුණයෙන් යුතු ව රචනා කෙරුණු මෙය තත්කාලීන සංස්කෘත සාහිත්‍යයේ තත්ත්වය පිළිබඳ කදිම උදාහරණයකි. තපස්සු-භල්ලුක නම් වෙළෙඳ ශ්‍රේෂ්ඨීන් විසින් බුදුරදුන්ගේ කේශධාතු නිදන් කොට ගිරිහඬු සෑය ඉදිකිරීම පිළිබඳ පුවත මෙහි සඳහන් කර තිබේ.

- මිහින්තලේ ත්‍රිකායස්තව සෙල්ලිපිය (EZ. Vol.IV, pp.134ff) (ක්‍රි.ව. 7-8 සියවස) - ශ්ලෝක තුනකින් සමන්විත මෙම සෙල්ලිපියෙහි මහායාන බෞද්ධ සම්ප්‍රදායයේ ප්‍රමුඛ සංකල්පයක් වන ත්‍රිකාය පිළිබඳ විස්තරයක් ඇතුළත් වේ. මෙය ද ග්‍රන්ථ අක්ෂරයෙන් රචනා වූවකි.

- අඥාතකර්තෘක ජේතවනාරාම සෙල්ලිපිය (EZ. Vol.I, pp.1ff) (ක්‍රි.ව. 9 සියවස) - මෙය ජේතවනරාම සෙල්ලිපිය යනුවෙන් හැඳින්වුව ද සැබැවින් ම පිහිටා ඇත්තේ වර්තමාන අභයගිරි පරිශ්‍රයේ ය. මෙම සෙල්ලිපිය සොයාගන්නා සමයේ දී (ක්‍රි.ව. 1894දී) මේ ස්ථාන දෙක පරස්පර ලෙස හඳුනාගෙන තිබීම ඊට හේතුව යි. ජේතවන විහාරයේ පරිපාලන කටයුතු හා සම්බන්ධ නීති රීති මෙම සෙල්ලිපියෙහි ඇතුළත් වී ඇති අතර දේවනාගරී අකුරෙන් ලියා ඇති ලක්දිව පැරණිතම ශිලාලේඛනය මෙය යි (ගුරුගේ, 1998 පි.75).

- සංඝනන්දින්ගේ කපාරාරාම ලිපිය (EZ. Vol.V, pp.162ff) (ක්‍රි.ව. 9-10 සියවස) - අභයගිරි වැසි සංඝනන්දින් නම් භික්ෂුව විසින් කපාරාරාමයේ වාසය කරන භික්ෂූන් වහන්සේට පාන වර්ග සැපයීම සඳහා ටංක 200ක් පරිත්‍යාග කිරීමේ පුවත මෙහි සඳහන් කර තිබේ. මුලින් ශ්‍රග්ධරා සහ ශ්ලෝක යන වෘත්ත දෙකෙන් පැබැඳුණු සංස්කෘත පද්‍ය දෙකක් යෙදී ඇති අතර අනතුරු ව සිංහල

පේළි දෙකක් යෙදී තිබේ.

අනුරාධපුර යුගයට අයත් සංස්කෘත ශිලාලේඛන ඇත්තේ මෙපමණක් වන අතර සංස්කෘත ශිලාලේඛන වැඩි ප්‍රමාණයක් හමුවන්නේ පොළොන්නරු යුගයට අදාළව යි. ඒ අතුරින් බහුතරයක් පිහිටුවා ඇත්තේ නිශ්ශංකමල්ල රජු විසිනි.

- පොළොන්නරුවේ වේලෙයික්කාරයින්ගේ සෙල්ලිපිය (EZ. Vol.II, pp.242ff) (ක්‍රි.ව. 11 සියවස) - දෙමළ ශිලාලේඛනයක් වන මෙහි ආරම්භක පද්‍යය සංස්කෘතයෙන් රචනා කර තිබේ. පළමුවන විජයබාහු රජුගේ රාජ්‍ය සමයේ රචනා කරන ලද්දක් සේ බොහෝදෙනා පිළිගත්ත ද සෙනරත් පරණවිතාන සූරීන්ගේ මතය වන්නේ මෙය පළමුවන විජයබාහු රජුට පශ්චාත්කාලීන වූ වික්‍රමබාහු (ක්‍රි.ව. 1116-1137) හෝ ගජබාහු (ක්‍රි.ව. 1137-1153) රාජ්‍ය සමයේ දී ලියැවෙන්නට ඇති බව යි (සේනානායක, 1998, පි.34).
- ත්‍රිකුණාමලයේ සංස්කෘත සෙල්ලිපිය (EZ. Vol.V, pp.170ff) - මෙය ද ක්‍රි.ව. 12 වන සියවසේ ලියැවෙන්නට ඇතැ යි අනුමාන කෙරේ. සංස්කෘත අකුරෙන් කොටා තිබේ. චෝඩගංග දේව නමැති කුමාරයකු පිළිබඳ ව ද සඳහන් වෙතත් ප්‍රස්තුතය කුමක් දැ යි පැහැදිලි නැත.
- ගල්පොත සෙල්ලිපිය (EZ. Vol.II, pp.98ff) - මෙය ද නිශ්ශංකමල්ල රජු විසින් පිහිටුවන ලද්දක් වන අතර සංස්කෘත පද්‍යයෙන් ආරම්භ කර ඇත.
- හැටදාගේ පුවරු ලිපිය (EZ. Vol.II, pp.84ff) - ක්‍රි.ව. 12 වන සියවසේ දී කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු විසින් කරවන ලද්දකි. සිංහල ලිපියක් වන මෙය සංස්කෘත පද්‍යයකින් ආරම්භ කර තිබේ.
- පොළොන්නරුවේ කලා ක්‍රීඩා විනෝද ගල් ආසන ලිපිය (EZ. Vol.II, pp.128ff) - නිශ්ශංකමල්ල රජු විසින් කරවන ලද්දක් වන මෙය ඉතා කුඩා ප්‍රමාණයේ ලිපියක්

වන අතර සංස්කෘතයෙන් ආරම්භ කර තිබේ. මේ අසුන ක්‍රි.ව. 1192-1196 කාලයේ දී පිහිටුවන්නට ඇතැ යි අනුමාන කෙරේ.

- පොළොන්නරුවේ උතුරු දොරටුවේ පුවරු ලිපිය (EZ. Vol.II, pp.157ff) - නිශ්ශංකමල්ල රජු විසින් පිහිටුවන ලද්දකැ යි අනුමාන කෙරෙන මෙම සෙල්ලිපියේ පළමුවන පද්‍යය සහ අවසාන පද්‍යය සංස්කෘත භාෂාවෙන් රචනා කර තිබේ. සෙල්ලිපියේ සෙසු කොටස රචනා කර ඇත්තේ සිංහල භාෂාවෙනි. මෙය නිශ්ශංකමල්ල රාජ ප්‍රශස්තියකි.
- පොළොන්නරුවේ ප්‍රීතිදානක මණ්ඩප සෙල්ලිපිය (EZ. Vol.II, pp.165ff) - මෙය ද නිශ්ශංකමල්ල රජු විසින් පිහිටුවන ලද්දක් වන අතර ආරම්භක සංස්කෘත ශ්ලෝකය හැර සෙසු කොටස සිංහලෙන් රචනා කර තිබේ. නිශ්ශංකමල්ල රජු පිළිබඳවත් මණ්ඩපය ඉදිකිරීම පිළිබඳවත් තොරතුරු ඇතුළත් කර තිබේ.
- පොළොන්නරුවේ සාහසමල්ලගේ පුවරු ලිපිය (EZ. Vol. II, pp.219ff) - මෙය සංස්කෘත මිශ්‍ර සිංහල බසින් රචනා කර ඇති අතර ලිපියේ ආරම්භයේ සහ අවසානයේ සංස්කෘත පද්‍යය බැගින් යොදා තිබේ. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ලගේ බාල සොහොයුරු වූ සිරිසඟබෝ කාලිංග විජයබාහු හෙවත් සාහසමල්ලගේ අභිෂේකයට අදාළ තොරතුරු මෙහි දක්වා ඇත.

ශිලාලේඛනය කවර බසකින් ලියනු ලැබුව ද සංස්කෘත පද්‍යයකින් ආරම්භ කර තිබීම ඉහත දක්වන ලද බොහෝ ලිපිවල කැපී පෙනෙන ලක්ෂණයකි. එකල සංස්කෘත භාෂාව ගෞරවාදරයකින් යුතු ව සලකා ඇති බවක් ඉන් පෙනීයයි. ශිලාලේඛන විෂයෙහි ද සංස්කෘත භාෂාව භාවිත කර තිබීම නිසා එකල හුදෙක් භික්ෂූන් සහ ප්‍රභූ ජනයා පමණක් නො ව සාමාන්‍ය ජනයා අතුරින් ඇතැමකු ද සංස්කෘත භාෂාව දැන සිටියේ යැයි අනුමාන කළ හැකි ය. එය එසේ නොවූයේ නම්

සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ශිලාලේඛන ප්‍රයෝජනවත් විය නො හැකි ය. වජ්‍රවර්මන් නමැත්තකු විසින් සීගිරියේ රචනා කරන ලද සංස්කෘත ගීය[1] ද සාමාන්‍ය ජනයා සංස්කෘත භාෂාව දැන සිටි බවට සාක්ෂ්‍යයක් වශයෙන් ගිණිය හැකි ය. තව ද, මෙම ශිලාලේඛනවලට අමතර ව සංස්කෘතයෙන් රචනා කරන ලද ලෝහපත් ද හමුවී තිබේ. මිහින්තලේ ඉඳිකටු සෑයෙන් සොයාගන්නා ලද තඹ පත්ඉරුවල (ක්‍රි.ව. 9-10 සියවස) පඤ්චවිංශති සාහස්‍රිකා ප්‍රඥාපාරමිතාවේ පළමු පරිච්ඡේදයෙන් උපුටාගන්නා ලද කොටස් සහ කාශ්‍යපපරිවර්තයෙන් උපුටාගන්නා ලද කොටස් හමුවේ. පබළු වෙහෙරෙන් සෙයාගත් තඹ තහඩු සහ ජේතවනාරාම රන්පත් ඉරු ද මේ යුගයට ම අයත් යැයි සැලකේ.

ඉහත දක්වන ලද අභිලේඛනවලට අමතර ව මෙම යුගයේ රචිත, විශේෂයෙන් පොළොන්නරු යුගයේ රචනා කරන ලද බොහෝ කෘතිවල සංස්කෘත භාෂාවේ සහ සාහිත්‍යයේ ආභාසය දක්නට ලැබේ. අනුරාධපුර යුගයේ දී පාලි භාෂා සාහිත්‍යයෙන් ද පොළොන්නරු යුගය වන විට සංස්කෘත භාෂා සාහිත්‍යයෙන් ද සිංහල භාෂා සාහිත්‍යය කෙරෙහි වූ මේ ආභාසය ශිලාලේඛන සහ තත්කාලීන කෘති ඇසුරෙන් ආනන්ද ගුරුගේ සූරීන් විසින් මැනවින් පෙන්වාදී තිබේ (ගුරුගේ, 1998 පිටු.78-86). පස්වන කාශ්‍යප රජු විසින් රචනා කරන ලද ධම්පියා අටුවා ගැටපදයේ (ක්‍රි.ව. 10 සියවස) ද සංස්කෘත කෘතිවලින් ගත් උද්ධෘත පාඨ බොහෝ ප්‍රමාණයක් හමුවේ. සිලාමේඝ සේන රජතුමා (ක්‍රි.ව. 833-853) විසින් රචනා කරන ලද සියබස්ලකර දණ්ඩින් විසින් සංස්කෘත බසින් රචනා කරන ලද කාව්‍යාදර්ශයේ සිංහල ඡායානුවාදයකි. තව ද, ධර්මප්‍රදීපිකා, අභිධර්මාර්ථසංග්‍රහ සන්නය වැනි කෘතිවල ද සංස්කෘත භාෂා සාහිත්‍යයේ ආභාසය බොහෝ සෙයින් දක්නට ලැබේ. ගුරුළුගෝමි සංස්කෘත කෘති 75කින් පද්‍ය උපුටා ස්වකීය ධර්මප්‍රදීපිකාවේ දක්වා ඇත (Pannasara Sthavira, (no date), p.18).

ලක්දිව සංස්කෘත සාහිත්‍යය සම්බන්ධයෙන් අතිශයින් වැදගත් වන්නේ සංස්කෘත බසින් ම රචනා කරන ලද ග්‍රන්ථයෝ ය. එහිලා අපට හමුවන පැරණිතම ග්‍රන්ථය සාරාර්ථසංග්‍රහය යි. එය ක්‍රි.ව. 398දී සිහසුන් පත් බුද්ධදාස රජු විසින් රචනා කරන ලද වෛද්‍යශාස්ත්‍රීය ග්‍රන්ථයකි. පද්‍ය 2600කින් පමණ යුක්ත පරිච්ඡේද 48ක් සහිත මෙම කෘතිය සඳහා වාග්භටගේ අෂ්ටාංගහෘදය, සුශ්‍රැතගේ සුශ්‍රැතසංහිතාව වැනි කෘතිවල ආභාසය ලැබී ඇති බව පෙනේ. කෘතිය සංස්කෘත බසින් ලියැවුණ ද එය පාලි පද්‍යයකින් අරඹා තිබීමෙන් එහි ශ්‍රී ලාංකික අනන්‍යතාව තහවුරු වන බව කිව හැකි ය. ලක්දිව රචිත සංස්කෘත කෘති අතර අග්‍රස්ථානයෙහිලා සැලකිය හැක්කේ කුමාරදාසයන්ගේ ජානකීහරණය යි. රාමායණ කතා පුවත වස්තු බීජය කරගෙන මෙය රචනා කර ඇත. මීට ඒ වන විට ද භාරතයේ ප්‍රචලිත ව පැවති අතිශය දියුණු සංස්කෘත මහාකාව්‍ය සම්ප්‍රදායයේ අභාසය නිරනුමාන ව ම ලැබෙන්නට ඇත. මෙම කෘතිය ක්‍රි.ව. 7-9 සියවස් අතර ලියැවෙන්නට ඇතැ යි අනුමාන කෙරේ. රත්න ශ්‍රී ඥාන නමැති භික්ෂුවක් විසින් රචනා කරන ලද කාව්‍යලක්ෂණ නම් කෘතිය දණ්ඩින්ගේ කාව්‍යාදර්ශයට සංස්කෘත බසින් කරන ලද භාෂ්‍යයකි. මෙම කෘතිය බෞද්ධ මූලාශ්‍රයවලින් ගත් උදාහරණවලින් මෙන් ම කාලිදාස, මාඝ වැනි කවීන්ගේ කෘතිවලින් ගත් උදාහරණවලින් ද පෝෂණය වී තිබේ. මෙම කතුවරයා විසින් ශබ්දාර්ථචින්තාවිවෘති නමින් ව්‍යාකරණ ශාස්ත්‍රීය කෘතියක් ද රචනා කරන ලදැ යි සඳහන් වන නමුත් එවැන්නක් මේ දක්වා සොයාගෙන නැත. රත්න ශ්‍රී ඥාන හිමියෝ මෙම කෘතියේ දී දණ්ඩින්ගේ සිද්ධාන්තවලට තමාගේ උදාහරණ සැපයීමත් දණ්ඩින්ගේ අලංකාර තවදුරටත් ප්‍රභේද කොට දැක්වීමත් සිදු කර තිබේ (සේනානායක, 1998 පි.30).

පොළොන්නරු යුගය වන විට සංස්කෘත අධ්‍යයනය කෙරෙහි ශ්‍රී ලාංකිකයාගේ නැඹුරුව අතිශයින් වර්ධනය වූයේ ය. මේ යුගය වන විට සංස්කෘත පිළිබඳ දැනුම කවරකුට හෝ පඬිවරයකු වීම සඳහා අතිශයින් අවශ්‍ය වූවක් බවට පත් ව තිබූ බව පෙනේ (Pannasara Sthavira, (no date), p.72). මෙකල දිඹුලාගල මහාකාශ්‍යප, මොග්ගල්ලාන, ධර්මකීර්ති, කච්චායන

වැනි තෙරවරු පාලියට මෙන් ම සංස්කෘත භාෂා ශාස්ත්‍ර දියුණුවට ද කටයුතු කළහ. අනුරුද්ධශතකය ක්‍රි.ව. 12 වන සියවසේදී එවකට උත්තරමූල ආයතනයෙහි අනුනායක ධුරන්ධර ව වැඩ විසූ අනුරුද්ධ නම් තෙර නමක් විසින් රචනා කරන ලද්දකි. මෙය පද්‍ය 101කින් සමන්විත ය. බුදුරජාණන් වහන්සේට කරන ස්තෝත්‍රයක් වශයෙන් රචනා කර ඇති නාමාෂ්ටශතකය උන්වහන්සේ කෙරෙහි ව්‍යවහාර කෙරෙන ගුණ පද 108ක් ඇතුළත් වූවකි. මෙය නාමාෂ්ටශතක යනුවෙන් හඳුන්වන්නට ඇත්තේ එනිසා විය හැකි යැයි ජී.එස්.බී. සේනානායක මහතා කියයි (සේනානායක, 1998 පි.27). මෙහි පද්‍ය 18කි. නාමාෂ්ටශතකයෙහි කතුවරයා පොළොන්නරු යුගයට (ක්‍රි.ව. 1120දී පමණ) අයත් සංස්කෘත ප්‍රවීණයකු විය යුතු යැයි දෙහිගස්පේ පඤ්ඤාසාර හිමි අනුමාන කරයි (Pannasara Sthavira, (no date), p.4). මෙම යුගයේ දී ම රචනා කරන ලද්දකැයි අනුමාන කෙරෙන බුද්ධගද්‍යය අඥාතකර්තෘක කෘතියක් වන අතර එය බුදුගුණ වර්ණනා කිරීමේ ආධ්‍යාශයෙන් රචනා කර ඇත. මෙම කෘතිය විදග්ධ භාෂා ශෛලියෙන් යුක්ත ය. සකස්කඩ ද මේ කාලයේ ම විසූ කිසියම් සංස්කෘතඥයකු විසින් රචනා කරන ලද්දක් බව දෙහිගස්පේ පඤ්ඤාසාර හිමියෝ සඳහන් කරති (Pannasara Sthavira, (no date), p.4).

ලක්දිව මුල්කාලීන සංස්කෘත අධ්‍යාපනය බොහෝ සෙයින් චාන්ද්‍ර ව්‍යාකරණ සම්ප්‍රදාය අනුගමනය කරන්නට ඇති බවක් පෙනේ. එම සම්ප්‍රදායෙහි නිර්මාපකයා වන චන්ද්‍රගෝමින් පාණිනී සම්ප්‍රදායට අනුගත වූවකු වුව ද පාණිනී සම්ප්‍රදායට වඩා චාන්ද්‍ර සම්ප්‍රදාය ලක්දිව ප්‍රචලිත වන්නට හේතුවන්නට ඇත්තේ ඔහු බෞද්ධයකු වීම විය හැකි ය (සේනානායක, 1998 පි.54). පොළොන්නරු යුගයේ රචනා වූ බාලාවබෝධනය චාන්ද්‍ර ව්‍යාකරණය අනුගමනය කරමින් දිඹුලාගල මහාකාශ්‍යප තෙරුන් විසින් සම්පාදනය කරන ලද්දකි. උන්වහන්සේ දිඹුලාගල විහාරයේ වැඩ විසූහ. උන්වහන්සේගේ ශිෂ්‍යවර ශාරිපුත්‍ර තෙරණුවෝ චාන්ද්‍ර ව්‍යාකරණයට පඤ්චිකාලංකාර නමින් ටීකාවක් ද ලියූහ. ලීනාර්ථදීප හෙවත් පාත්‍රීකරණ ටීකාව චාන්ද්‍ර ගුරුකුලයට අයත් ගුණාකරගේ පාත්‍රීකරණ යනුවෙන් හඳුන්වනු ලබන ව්‍යාකරණ

කෘතියට බුද්ධනාග නමැති භික්ෂුවක් විසින් රචනා කරන ලද කෘතියකි. මෙය ක්‍රි.ව. 12වන ශතවර්ෂයේ ද්විතීයාර්ධයේ රචිත ය. රූපාවතාරය වනාහි පාණිනී ව්‍යාකරණය අනුව යමින් රචනා කරන ලද ව්‍යාකරණ කෘතියකි. මෙහි කතුවරයා ධර්මකීර්ති නමැති භික්ෂුවකි. උන්වහන්සේ ජීවත් වූයේ පළමුවන පරාක්‍රමබාහු රාජසමයේ යැයි සැලකෙන හෙයින් ක්‍රි.ව. 12 වන සියවසට අයත් වේ. මෙම යුගයේ දී ම පදපංකජස්තව නමින් ද කෘතියක් රචනා වී ඇතැ යි සඳහන් වන නමුත් අඥාතකර්තෘක කෘතියක් වන මෙය දැනට නෂ්ටප්‍රාය ය (Pannasara Sthavira, (no date), p.7). ගුරුළුගෝමී අමාවතුරේදී පාදපංකජස්තව නම් කෘතියකින් පද්‍යයක් උපුටා දක්වා තිබේ.[2] මේවාට අමතර ව තවත් බොහෝ සාහිත්‍ය සාධක ලක්දිව සංස්කෘත භාවිතය සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරී තිබේ. තව ද දැනට හමු නොවෙතත් තවත් බොහෝ කෘති ප්‍රමාණයක් සංස්කෘත බසින් රචනා වී තිබෙන්නට ඇතැ යි ද අනුමාන කළ හැකි ය.

3 දඹදෙණි යුගයේ සංස්කෘත සාහිත්‍යය

දඹදෙණි යුගය ක්‍රි.ව. 1232 සිට ක්‍රි.ව. 1270 දක්වා පැවතුණේ යැයි සැලකේ. දඹදෙණිය ප්‍රථම වරට රාජධානිය බවට පත් කරගන්නා තෙවන විජයබාහු රජතුමා එහි රාජ්‍යත්වයට පත්වන්නේ ක්‍රි.ව. 1232දී ය. ඔහුගෙන් පසු ඔහුගේ පුත් දෙවන පරාක්‍රමබාහු රජතුමා ක්‍රි.ව. 1236දී සිහසුනට පත්විය. අනතුරු ව ඔහු පුත් සිව්වන විජයබාහු හෙවත් බෝසත් විජයබාහු ක්‍රි.ව. 1271දී රාජ්‍යත්වයට පත් වූ නමුත් ක්‍රි.ව. 1271දී මිත්ත නම් සෙනෙවියා විසින් ඔහු ඝාතනය කෙරිණි. ඉන් දඹදෙණි රාජධානි සමය ද අවසන් විය (ලියනගමගේ, 2007. පිටු.50-55).

දෙවන පරාක්‍රමබාහු රජු විසින් ඇතිකරන ලද සාමකාමී වාතාවරණය සාහිත්‍යයේ උන්නතිය සඳහා බෙහෙවින් හේතු වූ බැව් සහ එය සාහිත්‍ය සහ ශාස්ත්‍රීය ක්ෂේත්‍රයෙහි ඵලදායී යුගයක් වූ බැව් මෙකල ලියැවුණු සුවිසල් ග්‍රන්ථ සංඛ්‍යාවෙන් පැහැදිලි වේ (ලියනගමගේ, 1989, පි.266). කව්සිළුමිණ, සද්ධර්මරත්නාවලිය,

විශුද්ධිමාර්ගසන්නය, අටදා සන්නය, කුදුසික සන්නය, මහාරූපසිද්ධි සන්නය, එළු සඳස් ලකුණ, සිදත් සඟරාව වැනි සිංහල කෘතිත් සුබෝධාලංකාරය, වුත්තෝදය, රසවාහිනි, සමන්තකූටවණ්ණනා වැනි පාලි කෘතිත්, දෛවඥකාමධේනු වැනි සංස්කෘත කෘතිත් එහිලා කදිම නිදර්ශනයෝ ය. ධර්ම ග්‍රන්ථ නොවන මේ බොහෝ කෘති රචනා වී ඇත්තේ විවිධ විෂයයන් අළලා ය. මෙම යුගයේ ම පිහිටුවන ලද දඹදෙණි කතිකාවත නමින් ප්‍රසිද්ධ කතිකාවතෙන් මේ ඇතැම් ලෞකික විෂයයන් ඉගෙනීම හෝ ඉගැන්වීම තහනම් කර තිබියදී (ජයතිලක, 1955, පි.55) පවා ලෞකික විෂයයන්ට අදාළ බොහෝ කෘති සංඛ්‍යාවක් විවිධ භාෂාවලින් රචනා වී තිබේ. දඹදෙණි කතිකාව පිහිටුවීම සඳහා මූලිකත්වය ගෙන ඇත්තේ තත්කාලීන අරණ්‍යවාසී භික්ෂු පරපුර යි. මෙම ලෞකික ග්‍රන්ථ සම්පාදනයෙහිලා මූලිකත්වය ගෙන ඇත්තේ ග්‍රාමවාසී භික්ෂු සම්ප්‍රදාය යි. ඔවුන්ගේ ද අභිප්‍රාය වී ඇත්තේ 'ශුද්ධ මාගධික ව්‍යාවහාරිකයන්ගේ' එනම් මහා විහාර සම්ප්‍රදායයේ භාවිතයට ගැළපෙන අන්දමේ කාව්‍යාලංකාර සම්ප්‍රදායක් බිහි කිරීම යි (සුබෝධාලංකාරය, 1937, 1-2 පද්‍ය). මේ නිසා භික්ෂු අධ්‍යාපනයේ ස්වභාවය කවරාකාරයෙන් විය යුතු ද යන්න පිළිබඳ ව මෙම සම්ප්‍රදායයන් දෙක අතර එකිනෙකට වෙනස් එළඹුම් දෙකක් මෙකල පැවති බව මින් පෙනී යයි (තිලකසිරි, 2002, පිටු.102-105).

එමෙන් ම දඹදෙණි යුගයේ රචිත බොහෝ සිංහල කෘතිවල සංස්කෘත ආභාසය මැනවින් දක්නට ලැබේ. සිංහල භාෂාව සහ සාහිත්‍යය කෙරෙහි සංස්කෘත ආභාසය මුල සිට ම දක්නට ලැබුණු අතර එහි කූටප්‍රාප්තිය ක්‍රි.ව. 12වන සියවස පමණ සිදු විය (Hatthavavagallavihāravaṃsa, 1956, p.xiv). ආනන්ද කුලසූරිය දක්වන පරිදි එළු කව් ලොවේ සිළුමිණ වූ කව්සිළුමිණ ද සංස්කෘත මහාකාව්‍ය සම්ප්‍රදායය හා සසඳා බැලිය හැකි තත්ත්වයක පවතී.

''පැරණි කව් සමයේ නියර නොබිඳී කැරුණු මහ කවක් වන කව් සිළුමිණ නොයෙක් තැන දී සකු කිවියන්ගේ රචනාවන් හා සැසඳීමට භාජන කළ හැකි වන්නේ ය. මෙහි එන කුස රජ

වැනුම රඝුවංශයේ දිලීප රාජ වර්ණනය සමඟ හෝ රඝුරාජ වර්ණනය සමඟ හෝ සැසඳීමට පිළිවන. සැඳෑ නිස වැනුම ජානකීහරණයෙහි එන එ බඳු වැනුම් හා සසඳා බැලිය හැකි ය. අවන් කෙළි වැනුම ද ජානකීහරණයෙහි එන මධුපාන වර්ණනය හා සසඳන්නට පිළිවන. එලෙසට ම ගිම්, මේ, සරා යන වැනුම් ද රඝුවංශයේ පෙනෙන එ බඳු වැනුම් හා සැසඳිය හැකි වෙයි. උයන් කෙළි වැනුමට සම කළ හැකි වැනුමක් ජානකීහරණයෙහි ඇත. දිය කෙළි වැනුමට ළං කළ හැකි වැනුම් ජානකීහරණ, රඝුවංශ යන මහ කව් දෙක්හි ම ඇත. කුස වලපට ළං කළ හැකි ය රඝුවංශයෙහි ඇති අජ වැලපිල්ල. එසේ ම අප කිවියන්ගේ පබවත වලපට නෑ කම් කියන වැනුම් රඝුවංශයේ සීතා විලාපයෙහි හා කුමාර-සම්භවයේ රති විලාපයෙහි ඇත. අශ්වඝෝෂ මහ කිවියන්ගේ සෞන්දරනන්දයේ සුන්දරී වැලපිල්ල ද අප කිවියන්ගේ වැනුම හා සසඳා බැලීම වටනේ ය. මේ හැර මාඝයන්ගේ ශිශුපාල වධයෙහිත් කාලිදාසයන්ගේ කුමාර-සම්භවයෙහිත් හෙළ කිවියන්ගේ වැනුම්වලට සම කළ හැකි තැන් රැසක් ඇත.''[3] (කුලසූරිය, 1963, පි.196) සංස්කෘත අලංකාරවාදය අනුරාධපුර යුගයේ සිට ම සිංහල සාහිත්‍යය කෙරෙහි බලපෑ අතර දඹදෙණි අවධිය වන විට භාරතයේ හැදී වැඩී පෝෂණය වූ අනෙකුත් විචාර වාද ද දඹදෙණිය අවධිය වන විට මෙරටට සංක්‍රමණය වී තිබූ බවත් සිංහල සාහිත්‍යය කෙරෙහි බලපවත්වන්නට වූ බවත් සුබෝධාලංකාර සන්නය වැනි කෘතිවලින් පැහැදිලි වේ (තිලකසිරි, 2002, පිටු.105-107). එහි ප්‍රතිඵලය වූයේ කව්සිළුමිණ වැනි අගනා මහාකාව්‍යයක් බිහි වීම යි.

එමෙන් ම මෙකල ලියැවුණු සිංහල කෘතිවල සංස්කෘත ග්‍රන්ථවලින් කෙරෙන උපුටා ගැනීම් ද බෙහෙවින් දැකිය හැකි ය. විශුද්ධිමාර්ග සන්නයෙන් එහි කතුවරයා විදග්ධ සංස්කෘතඥයකු බව පෙනේ. ඔහු ජෝතිපාලයන්ගේ (?) ආර්යසත්‍යාවතාර, වසුබන්ධුපාදයන්ගේ අභිධර්මකෝශ, අශ්වඝෝෂපාදයන්ගේ සෞන්දරනන්දය, මනුස්මෘතිය, ඥෙයසම්පත්තිටීකා (ඥෙයසප්තටීකා) වැනි පොත්වලින් සහ තවත් වෙනත් බොහෝ සංස්කෘත කෘතිවලින් උපුටා දැක්වීම් කර තිබේ (කුලසූරිය, 1963,

පි.126). මීට අමතර ව දිඞ්නාග, ජෝතිපාල, නාගබෝධි, ධර්මකීර්ති, රාහුල, කණාද ආදීන්ගේ මතවාද ද විශුද්ධිමාර්ග සන්නයේ දී ඇසුරු කර තිබේ (තිලකසිරි, 2002, පි.49).

සංස්කෘත භාෂාවේ ආභාසය විශුද්ධිමාර්ග සන්නය පුරා ම නො අඩු ව දක්නට ලැබේ. ග්‍රන්ථ ප්‍රයෝජන දක්වන පහත සඳහන් පාඨය එහිලා එක් උදාහරණයකි.

''ප්‍රයෝජන විවිධ වේ - මුඛ්‍යානුෂඞ්ගික වශයෙන් එහි ප්‍රියශීල ප්‍රතිපත්ති වත්සල සුශික්ෂිත මුමුක්ෂිත යෝගී ජනයාහට ප්‍රීත්‍යුත්පාදනය මුඛ්‍ය ප්‍රයෝජන ය. චතුෂ්පාරිශුද්ධි ශීලයෙහි සුප්‍රතිෂ්ඨිත ව අධිශීල ශික්ෂා සිද්ධ කොට ස්වචරිතානුකූල කර්මස්ථාන පරිග්‍රහාදි ක්‍රමයෙන් පැවැත භාවනා ප්‍රකර්ෂපර්‍යන්තජන්මක ලොකොත්තර ඥාන සිද්ධීන් අධිප්‍රඥා ශික්ෂායෙහි මස්තකප්‍රාප්ත ව පරම දක්ෂිණීය ක්ෂිණීයාශ්‍රව භාවයට සම්ප්‍රාප්ත ව සමාපත්ති සුඛානුභාවයෙන් දවස් යවා නිරුපධිශෙෂ නිර්වාණ ධාත්වමෘත පද ප්‍රාප්ත වනු මෙහි ආනුෂඞ්ගික ප්‍රයෝජන යයි දත යුතු යි.'' (සන්න සහිත විශුද්ධිමාර්ගය, 1949, පි.3)

දෙවන පරාක්‍රමබාහු රජු මනු නීතිය පිළිබඳ විශාරදයකු බැව් මහාවංසයෙහි සඳහන් වේ (මහාවංසො, 1959, lxxxii.2). එහෙයින් එහි ආභාසය සන්නයට ලැබී තිබේ. රාහුල නමැති පඬිවරයකුට අයත් කරමින් පහත දැක්වෙන පද්‍යය විශුද්ධිමාර්ග සන්නයේ එක් තැනෙක දක්වා තිබේ.

''බුද්ධ ඉත්‍යවගමනෙ යං ධාතුඃ පරිපඨ්‍යතෙ යතස්තගෙඥඃ

ගත්‍යර්ථ ඉත්‍යතො'ස්මාත් කර්තර්‍යපි යුජ්‍යතෙ යංක්තඃ''

(සන්න සහිත විශුද්ධිමාර්ගය, 1949, පි.3)

'භග' යන ශබ්දය විවරණය කරමින් පහත දැක්වෙන පද්‍යය තවත් තැනෙක උද්ධෘත කර තිබේ.

''ඓශ්වර්‍යස්‍ය සමග්‍රස්‍ය ධර්මස්‍ය යශසශ්ශ්‍රියඃ

කාමස්‍යාථ ප්‍රයත්නස්‍ය ෂණ්ණං භග ඉතීංගනා''

(සන්න සහිත විශුද්ධිමාර්ගය, 1949, පි.510)

තවත් තැනෙකදී පාළි පාඨයක් තෝරමින් විශුද්ධිමාර්ග සන්නකරුවා සංස්කෘත ව්‍යාකරණයේ බොහෝ සෙයින් ප්‍රසිද්ධ පහත දැක්වෙන ශ්ලෝකය උද්ධෘත කර තිබේ.

''වර්ණාගමො වර්ණ්ණවිපර්යයශ්ච

ද්වෞචාපරෞ වර්ණ්ණවිකාරනාශෞ

ධාතොස්තදර්ථාතිශයෙන යොගස්

තදුච්‍යතෙ පඤ්චවිධං නිරුක්තම්''

(සන්න සහිත විශුද්ධිමාර්ගය, 1949, පි.506)

හත්ථවනගල්ලවිහාරවංසය වැනි පාලි කෘතිවලට ද සංස්කෘත ආභාසය ලැබී ඇති බව පෙනේ. මෙය රචනා වන්නට ඇත්තේ පාලි සහ සංස්කෘත අධ්‍යයනය මේ දිවයිනෙහි එක් ව වැඩෙන අවස්ථාවකදී යැයි චාල්ස් ගොඩකුඹුර සඳහන් කරයි. කාදම්බරී, සහ ජාතකමාලා වැනි සංස්කෘත ග්‍රන්ථවල ආභාසය හත්ථවනගල්ලවිහාරවංසයට ලැබී තිබේ (Hatthavavagallavihāravaṃsa, 1956, p.ix). මේ අතුරින් ද ජාතකමාලාවේ ආභාසය බොහෝ සෙයින් මීට ලැබෙන්නට ඇතැ යි ගොඩකුඹුර සිතයි (Hatthavavagallavihāravaṃsa, 1956, p.xiv).

දඹදෙණි අවධියේ සංස්කෘත සාහිත්‍යය පිළිබඳ විමසීමේදී අත්හළ නො හැකි ශිලාලේඛන කිහිපයක් ද වේ. ගලපාත විහාර ලිපිය (EZ, Vol. IV, pp.196ff) ඉන් එකකි. කිසියම් පැරකුම්බා රජකුගේ රාජාභිෂේකයේ සිට අවුරුදු 13කින් පසු ව ගලපාත විහාරයට කරන ලද පූජාවක් පිළිබඳ ව මෙහි සඳහන් වේ. මෙය දෙවන පැරකුම්බාවන්ගේ රාජ සමයේ පිහිටුවන ලද්දක් බවට මතයක් ඉදිරිපත් ව ඇතත් ඇතැමෙක් මෙය පළමුවන පැරකුම්බාවන්ගේ සමයට අයත් වූවක් විය හැකි යැයි කියති. මෙහි පළමු පද්‍යය සංස්කෘත බසින් ශාර්දූලවික්‍රීඩිත වෘත්තයෙන් රචනා වූවක් වන අතර සෙසු කොටස සිංහලෙනි. තවත් වැදගත්

ශිලාලේඛනයක් වනුයේ නියම්ගම්පාය සෙල්ලිපිය යි. මෙය නියම්ගම්පායෙහි කුළුණක කොටා ඇති අතර සංස්කෘත පද්‍ය කිහිපයක් ම ඇතුළත් වූවකි. ශකවර්ෂ 1259දී හෙවත් ක්‍රි.ව. 1336-1337දී පිහිටුවා තිබේ.

දඹදෙණි යුගයේ ලියැවුණු සංස්කෘත කෘති අතුරින් උසස්තම කෘතිය වනාහි අනවමදර්ශී සංඝරාජයන් විසින් රචනා කරන ලද දෛවඥකාමධේනුව යි.

4 අනවමදර්ශී සංඝරාජයන් වහන්සේ

අනවමදර්ශී (පා. අනොමදස්සී) තෙරුන් පිළිබඳ ව මහාවංසයේත් හත්‍ථවනගල්ලවිහාරවංසයේත් එලු අත්තනගලුවංශයේත් දෛවඥකාමධේනුවේත් සඳහන් වී තිබේ. මහාවංසයට අනුව අනවමදර්ශී මා හිමියෝ දෙවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ (ක්‍රි.ව. 1236-1271) ජීවත් වූහ (මහාවංසො, 1959, lxxxiv, 37-39). උන්වහන්සේ හත්‍ථවනගල්ල (වර්තමාන අත්තනගල්ල) විහාරයේ වැඩ වාසය කර ඇත. හත්ථවනගල්ලවිහාරවංස කතුවරයා දක්වන පරිදි එම කෘතිය රචනා කිරීම සඳහා අනවමදර්ශී මා හිමි ඔහු ධෛර්යවත් කර තිබේ. එහි දැක්වෙන පරිදි උන්වහන්සේ බ්‍රාහ්මණ වංශිකයෙකි (Hatthavavagallavihāravaṃsa, 1956, i.3). මහාවංසයට අනුව උන්වහන්සේ දඹදෙණියේ රජ කළ දෙවන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1236-1271) සමඟ සමීප සබඳතා පවත්වා තිබේ. මේ පදවිය නිසා හත්‍ථවනගල්ලවිහාරවංසය උන්වහන්සේ හඳුන්වා ඇත්තේ 'සබ්බයතිරාජ' (Hatthavavagallavihāravaṃsa, 1956, i.3) යනුවෙනි. දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ උපදෙස් පරිදි දේවපතිරාජ ඇමති හත්‍ථවනගල්ල විහාරය තෙමහල් කොට සාදවා තෙරුන්ට පූජා කර තිබේ (Hatthavavagallavihāravaṃsa, 1956, pp.28-29). නිකාය සංග්‍රහයේ ශාරිපුත්‍ර සංඝරාජයන්ට පසු ව බෞද්ධ සාහිත්‍ය දියුණු කිරීමෙහිලා පුරෝගාමී වූ යතිවරුන් දක්වන තැන අනවදර්ශී මා හිමියන්ගේ නම ද සඳහන් කර තිබීමෙන් (නිකාය සංග්‍රහය, 1934, පිටු.27-28) උන්වහන්සේ

ශ්‍රේෂ්ඨ ග්‍රන්ථකාර යතිවරුන් හා සම කක්‍ෂයෙහිලා සලකන ලද බැව් පෙනේ.

අනවමදර්ශී මා හිමිපාණන් වහන්සේ විසින් රචනා කරන ලද දෛවඥකාමධේනුවේ තමන් පිළිබඳ ව උන්වහන්සේ ම මෙසේ සඳහන් කර තිබේ.

''අනුගතජිනශිෂ්ටිර්බ්‍රහ්මවංශෛකදෘෂ්ටිර්

මුනිරනවමදර්ශී පාරදර්ශී කලානාම්

ප්‍රණයති සකලාං සද්ග්‍රන්ථසාරාර්ථදොග්ධ්‍රීං

විබුධජනනිෂෙව්‍යාදෛවවිත්කාමධෙනුම්''

(Daivajñakāmadhenuḥ, 1906, i.1)

(බුදුරදුන්ගේ අනුශාසනය අනුගමනය කරන්නා වූ බ්‍රාහ්මණ වංශයට එක ම ඇසක් වූ සියලු කලාවන්හි කෙළවර දුටුවා වූ අනවමදර්ශී හිමි සියලු උසස් ග්‍රන්ථවල සාරය නමැති කිරි දෙන්නා වූ නැණවතුන් විසින් ඇසුරු කළ යුතු ජ්‍යෝතිෂඥයන්ට කාමධේනුවක් (හෙවත් දෛවඥකාමධේනු නම්) වූ මෙම කෘතිය නිමවයි.)

දෛවඥකාමධේනුවට අමතර ව අනවමදර්ශී මා හිමිපාණන් විසින් දැනට නෂ්ටප්‍රාය පරෝපකාර නම් ජ්‍යෝතිෂ කෘතිය ද රචනා කරන ලදැ යි ඩබ්. ඇෆ්. ගුණවර්ධන මුදලිතුමා ස්වකීය සිද්ධාන්ත පරීක්‍ෂණයෙහි සඳහන් කර තිබේ (ගුණවර්ධන, 1959, පි.54).

''ප්‍රතිනෘපතිමහාවිහාරනෙතා

ක්‍ෂිතිසුරවංශජනිර්මුනීන්ද්‍රසූනුඃ

ඉදමනවමදර්ශිනාමධෙයඃ

පරමකරොත් කරණං පරොපකාරම්''

(ප්‍රතිරාජ මහාවිහාරයේ අධිපති වූ බ්‍රාහ්මණ වංශයෙහි උපන්නා වූ බුද්ධ පුත්‍ර අනවමදර්ශී නම ඇත්තා මේ මාහැඟි

පරෝපකාරය රචනා කළේ ය.)

ඉහත ගාථාවේ දැක්වෙන පරිදි අනවමදර්ශී මා හිමියෝ ප්‍රතිරාජ පරිවේණාධිපති වශයෙන් ද කටයුතු කර තිබේ. මේ නිසා මෙම යුගයේ දී ම රචනා කර ඇති සිංහල ව්‍යාකරණ කෘතිය වන සිදත් සඟරාව ද උන්වහන්සේගේ කෘතියකැ යි ඇතැමෙක් සිතති. රත්මලානේ ශ්‍රී ධර්මාරාම නා හිමියන් ද දක්වන පරිදි සිදත් සඟරාව වේදේහ හිමියන්ගේ කෘතියක් බැව් සමන්තකූටවණ්ණනාවේ කර්තෘ සන්දර්ශනයෙන් (සමන්තකූටවර්ණ්ණනාව, බු.ව. 2433, පි.231) සහ රසවාහිනියේ කර්තෘ සන්දර්ශනයෙන් (රසවාහිනි, බු.ව. 2464, පි.194) පෙනීයයි. ගොඩකුඹුරට අනුව හත්ථවනගල්ලවිහාරවංසයේත් සිදත් සඟරාවේත් කතුවරයා එක් අයකු වීමේ ඉහළ සම්භාවිතාවක් ඇත (Hatthavavagallavihāravaṃsa, 1956, p.x). දෙහිගස්පේ පඤ්ඤාසාර හිමියෝ සිදත් සඟරාවේ සහ දෛවඥකාමධේනුවේ පැනෙන යම් යම් සමානතා පෙන්වාදෙමින් මේ කෘතිද්වය ම එක් කතුවරයකුගේ යැයි ද එම කතුවරයා අනවදර්ශී මා හිමියන් යැයි අනුමාන කිරීමට ඉහළ සම්භාවිතාවක් ඇතැ යි ද සඳහන් කරති (Pannasara Sthavira, (no date), pp.208-209). සිදත් සඟරාවේ මේ කර්තෘ භින්නතාව පිළිබඳ දීර්ඝ විවරණයක් කරමින් විමල් ජී. බලගල්ලේ අවසානයේ මෙය දෛවඥකාමධේනු, පරෝපකාර, සහ හත්ථවනගල්ලවිහාරවංස යන කෘති ත්‍රිත්වයේ කතුවරයා වූ අනවදර්ශී මා හිමි සිදත් සඟරාවේ ද කතුවරයා බැව් නිගමනය කරයි (බලගල්ලේ, 2003, පි.49). මේ නිසා උන්වහන්සේ සංස්කෘත සහ සිංහල යන සාහිත්‍ය ද්වයට ම විශිෂ්ට සේවාවක් සිදු කළ සාහිත්‍යධරයකු බව පෙනේ.

අනවමදර්ශී මා හිමියන්ගේ ජීවදත්ත තොරතුරු අල්ප වුව ද අනවදර්ශී මා හිමියෝ උසස් භාෂා-ශාස්ත්‍ර ඥානයකින් සහ සුනිශිත ප්‍රඥා පාටවයකින් යුක්ත වූවකු බැව් උන්වහන්සේගේ කෘතියෙන් පෙනේ.

5 දෛවඥකාමධේනු

''දෛවය දන්නා තැනැත්තාගේ සුරභි දෙන'' යන

අර්ථය දරන නම ඇති දෛවඥකාමධේනු නම් මාහැඟි ග්‍රන්ථය ක්‍රි.ව. 1235දී රචනා කර ඇතැ යි දෙහිගස්පේ පඤ්ඤාසාර හිමි කියයි (Pannasara Sthavira, (no date), p.5). සෑම ප්‍රකරණයක් අවසානයේ ම කතුවරයා විසින් සිය කෘතිය හඳුන්වනු ලැබ ඇත්තේ දෛවඥකාමධේනු යනුවෙනි. එහෙත් පළමු අධ්‍යායයේ දෙවන ශ්ලෝකයේ දී (ඉහත දක්වා ඇත.) සහ කර්තෘ සන්දර්ශන පද්‍ය දෙකේදී[4] එය හඳුන්වනු ලැබ ඇත්තේ ''දෛවවිත්කාමධේනු'' යනුවෙනි. දෙහිගස්පේ පඤ්ඤාසාර හිමියෝ මෙය අසාමාන්‍ය තත්ත්වයක් වශයෙන් දක්වා ඇතත් (Pannasara Sthavira, (no date), p.204) ඡන්දස හේතුවෙන් මෙවැනි සමානාර්ථ යෙදුම් භාවිත කිරීම සංස්කෘත සාහිත්‍යයේ එතරම් සුලබ නො වෙතත් අභාවිත ලක්ෂණයක් නො වේ. සංස්කෘතයෙන් රචිත ජ්‍යෝතිෂ ග්‍රන්ථයක් වන බ්‍රාහ්මසිද්ධාන්තය ඇතැම් විටක පෛතාමහසිද්ධාන්ත යනුවෙන් ද හඳුන්වා තිබේ.

5.1 අන්තර්ගතය

අනවමදර්ශී මා හිමියෝ සම්බුද්ධ නමස්කාරය කරමින් ස්වකීය දෛවඥකාමධේනුව පහත දැක්වෙන මංගලාචරණයෙන් අරඹති.

''ප්‍රතිඵලන්ති ජගන්ති සමන්තතො
මහති යද්ධිෂණාමණිදර්පණෙ
ස භගවාන් මුනිරීහිතසිද්ධයෙ
හෘදි චිරං මම ගන්ධකුටීයතාම්''

(Daivajñakāmadhenuḥ, 1906, i.1)

(යම් කිසි කෙනකුගේ මහත් වූ ප්‍රඥා නමැති මණිදර්පණයෙහි හාත්පස ලෝකය පිළිබිඹු වී පෙනේ ද ඒ භාග්‍යවත් මුනිතුමා [මගේ] අපේක්ෂා සාධනය සඳහා මගේ හදවත ගඳකිළියක් බවට පත්කරත්වා.)

දෛවඥකාමධේනුව භාරතීය ජ්‍යෝතිෂයේ ප්‍රධාන

ස්කන්ධත්‍රය (Subbarayappa and Sarma, 1985, pp.2-3) අතුරින් සංහිතා සහ හෝරා යන ස්කන්ධ දෙකට ම අදාළ තොරතුරු ඉදිරිපත් කරන ග්‍රන්ථයක් වශයෙන් හැඳින්විය හැකි ය. මෙහි චරිත, ආදේශ, සහ මංගලවිධාන යනුවෙන් ප්‍රකරණ 03කි. චරිතප්‍රකරණයේ ග්‍රහස්වභාව ද ආදේශප්‍රකරණයේ විවිධ ඵලාඵල ද මංගලවිධානප්‍රකරණයේ නිමිති සහ ශුභ මුහූර්ත පිළිබඳ විස්තර ද දක්වා තිබේ. මේ එක් එක් ප්‍රකරණයක් අධ්‍යාය වශයෙන් 10කට බෙදා තිබේ. සමස්තයක් වශයෙන් අධ්‍යාය 30 පුරා පද්‍ය 2605ක් අන්තර්ගත වේ. මීට අමතර ව අධ්‍යායයන්ට අයත් නොවන කර්තෘ පරිසමාප්ති පද්‍යද්වයක් ද ඇතුළත් වේ. සමස්ත කෘතියේ අන්තර්ගතය ප්‍රකරණ සහ අධ්‍යාය වශයෙන් පහත දැක්වෙන පරිදි වගුගත කර දැක්විය හැකි ය.

ප්‍රකරණය	අධ්‍යාය	අධ්‍යාය නාමය	පද්‍ය ගණන	අන්තර්ගතය
	1	සාමාන්‍යවිධි	32	අහර්ගණය සෙවීම, ලංකාවේ (මූලාශ්‍රය ලක්‍ෂයේ හෙවත් 0° අක්‍ෂාංශය සහ 0°දේශාංශය හමුවන ලක්‍ෂයේ) පිහිටීම ආදිය
චරිත	2	ආදිත්‍යචරිත	84	සූර්ය ස්වභාව, සංවත්සර ඵල ආදිය
	3	චන්ද්‍රචරිත	139	චන්ද්‍ර ස්වභාව, පඤ්චාංග, විවිධ යෝග ආදිය
	4	භෞමචරිත	72	අඟහරු ස්වභාව, සංක්‍රාන්ති නිර්ණය ආදිය
	5	බුධචරිත	23	බුධ ස්වභාව
	6	ජීවචරිත	65	බ්‍රහස්පති ස්වභාව, ෂෂ්ටි වර්ෂ ඵල ආදිය
	7	ශුක්‍රචරිත	36	සිකුරු ස්වභාව
	8	ශනෛශ-ᵖචරචරිත	33	සෙනසුරු ස්වභාව
	9	රාහුචරිත	89	රාහු ස්වභාව, සූර්ය සහ චන්ද්‍ර ග්‍රහණ ආදිය
	10	සංකීර්ණචරිත	88	විවිධ ග්‍රහ වස්තුවල ගමන සහ ඒවායේ ස්වභාව ආදිය

ප්‍රකරණය	අධ්‍යාය	අධ්‍යාය නාමය	පද්‍ය ගණන	අන්තර්ගතය
ආදේශ	11	සාමාන්‍යාදෙශවිධි	64	තාරකා යෝග සහ ඒවායේ ඵල ආදිය
	12	ආයුර්දායාදෙශ	65	මිනිසුන්ගේ ආයුෂ නිර්ණය
	13	දශාවිපාකාදෙශ	70	ඒ ඒ දශාවල විපාක
	14	අෂ්ටකවර්ගාදෙශ	40	ග්‍රහයන්ගේ අෂ්ටක වර්ගය
	15	යොගගුණාදෙශ	119	යෝග 31හි ඵල
	16	අංගලක්ෂණාදෙශ	51	ශරීරයේ ස්වාභාවික ලක්ෂණවල ඵල, ස්ත්‍රී-පුරුෂ ලක්ෂණ
	17	දෙහොත්පාතාදෙශ	46	ශරීරයේ අස්වාභාවික ලක්ෂණවල (උත්පාතවල) ඵල
	18	ස්වප්නාදෙශ	38	සිහින ඵලාඵල
	19	තිර්යග්චරිතාදෙශ	84	විවිධ සතුන්ගේ හැසිරීම් සහ ශබ්ද ආදියෙහි අර්ථකථන
	20	සංකීර්ණාදෙශ	274	මිනිසුන්ට ඇතිවන විවිධ ගැටලුවලට පිළියම්, සෞඛ්‍යය සහ ආයුෂ පරීක්ෂාව, සතුරු පීඩා ආදිය

ප්‍රකරණය	අධ්‍යාය	අධ්‍යාය නාමය	පද්‍ය ගණන	අන්තර්ගතය
මංගලවිධාන	21	සාමාන්‍යවිධි	53	ශුභාශුභ නැකැත්, තිථි ආදිය, මුහූර්ත පිළිබඳ විශේෂ කරුණු
	22	දොෂශුද්ධිවිධාන	94	දෝෂ ලක්ෂණ සහ දෝෂ භංග විධි ආදිය
	23	ගර්භදශාවිධාන	37	මල්වර ඵල, විවිධ සංස්කාර ඵල ආදිය
	24	කුමාරදශාවිධාන	171	ළමා කාලයට අදාළ සංස්කාර විධි ආදිය
	25	ශික්ෂාවිධාන	77	ළමා පෝෂණය සහ ඔවුන්ට ඉගැන්වීමේ ක්‍රම ආදිය
	26	යෞවනදශාවිධාන	129	යුවරාජ උපදේශ, කාකපිණ්ඩ පරීක්ෂා, විවාහ පරීක්ෂා, පොරොන්දම් ගැළපීම ආදිය
	27	උපභොගදශාවිධාන	160	ගෘහකර්ම, විනෝද විධි, සහ භූෂණ විධි ආදිය
	28	උපචයදශාවිධාන	79	කෘෂිකර්මය සහ වෙළඳාම සම්බන්ධ කරුණු
	29	වීරදශාවිධාන	85	යාත්‍රා විධාන, අභීෂ්ට සිද්ධි යෝග සහ යාත්‍රා භක්ෂ්‍ය ආදිය
	30	සංකීර්ණාදෙශවිධාන	208	ආධ්‍යාත්මික විධාන, විවිධ චිකිත්සා ක්‍රම ආදිය

1 වගුව

දෛවඥකාමධේනුවේ මුල් කොටසේ වාක්‍ය ගණිත ක්‍රමය

හා සැසඳෙන යෙදුම් ඇත (දෛවඥකාමධේනු, 1989, පි.vii). මෙම ක්‍රමය භාරතීය ජ්‍යොතිෂ ග්‍රන්ථවල හමුවන සංඛ්‍යා ඉදිරිපත් කිරීම සඳහා භාවිත සුවිශේෂී ක්‍රමයකි. මෙහි දී සිදුවන්නේ කටපයාදි ක්‍රමය භාවිත කරමින් තාරකාශාස්ත්‍රයට අදාළ පරාමිතීන් කේතීකරණය (coding) කිරීම යි. කටපයාදි ක්‍රමය භාවිත කරමින් සංඛ්‍යා ඉදිරිපත් කිරීම වාක්‍ය ගණිත ක්‍රමයට පමණක් විශේෂ වූවක් නො වේ. එය ඡන්දස් ආදි අනෙකුත් ශාස්ත්‍රවල ද පුරාණයේ සිට බෙහෙවින් භාවිත වූවකි. එහෙත් වාක්‍ය ගණිත ක්‍රමයේ දී සිදුවන්නේ කිසියම් අර්ථවත් සංස්කෘත වාක්‍යයක් සැකසෙන පරිදි කටපයාදි ක්‍රමය භාවිත කිරීම යි (Pai et al, 2016, p.431). මේ නිසා එක් අයුරකින් මෙම වාක්‍ය තාරකාශාස්ත්‍රයට අදාළ පරාමිතීන් දක්වන අතර වෙනත් අයුරකින් කිසියම් අර්ථාන්විත අදහසක් ද ඉදිරිපත් කරයි. අඥාතකර්තෘක වාක්‍යකරණ, සංගමග්‍රාමයේ මාධවගේ වේණ්වාරෝහ, සහ ස්ඵුටචන්ද්‍රාප්ති, සහ පුථුමන සෝමයාජිගේ කරණපද්ධති යනු මුළුමනින් ම මෙම ක්‍රමය අනුගමනය කරමින් රචනා වූ සංස්කෘත ජ්‍යෝතිෂ ග්‍රන්ථ කිහිපයකි (Sriram, 2015, p.1991). දෛවඥකාමධේනුවේ හමුවන වාක්‍ය ක්‍රමය සඳහා උදාහරණ කිහිපයක් පහත දක්වා තිබේ.

වාක්‍යය	සංඛ්‍යාව	පද්‍යාංකය
ගාත්‍රතුංග	3623	i.19
නානාදීප	1800	i.19
මම ශාසණම්	57555	i.20
උච්චාටා	160	i.21
සත්කවිඃ	417	i.21
ජිතාමාත්‍යාඃ	1568	i.21
නනොනටඃ	1000	i.21

2 වගුව

දෛවඥකාමධේනුවේ අන්තර්ගතය හුදෙක් ජ්‍යෝතිෂයේ

සෛද්ධාන්තික කරුණුවලට හෝ සංස්කාර, නිමිති, ඵලාඵල ආදි කරුණුවලට හෝ පමණක් සීමා වූයේ නො වේ. ඍජු ලෙස ම නොවුණ ද ජ්‍යෝතිෂයට යම් අයුරකින් සම්බන්ධ යාතුකර්ම, මන්ත්‍ර ආදිය ද එහි ඇතුළත් වී තිබේ. පහත දැක්වෙන්නේ ඊට උදාහරණ කිහිපයකි.

ප්‍රාර්ථනා ඉටු කරගැනීම සඳහා සහ අනාගතය දැනගැනීම සඳහා අදාළ වත්පිළිවෙත් සමග පහත දැක්වෙන මන්ත්‍රය භාවිත කළ යුතු යැයි 18වන පරිච්ඡේදයේ දක්වා තිබේ.

''ඕං ත්‍රිජටාලම්බොදරවාමන කක්‍ෂකඵාය හුං හුං ඵට් ඵට් ස්වාහා'' (Daivajñakāmadhenuḥ, 1906, i.1).

කපුටන්ට බලි පුදන විට ප්‍රකාශ කිරීම සඳහා පහත දැක්වෙන මන්ත්‍රය නිර්දේශ කර තිබේ.

''ඕං දීර්ඝායුඃ සුමංගලා ච ඉන්ද්‍රදිග්දෙවෙභ්‍යඃ ස්වාහා.

ඕං චිරං තිෂ්ඨතු දීර්ඝායුර්යාම්‍යදිග්දෙවෙභ්‍යඃ ස්වාහා.

ඕං භද්‍රො වරුණදිග්දෙවෙභ්‍යඃ ස්වාහා.

ඕං ශ්‍රෙයඃ සෞම්‍යදිග්දෙවෙභ්‍යඃ ස්වාහා.

ඕං පුත්‍රපෞත්‍රවෘද්ධිඃ ස්‍යාච්චතුර්මුඛෙභ්‍යඃ ස්වාහා.

අඞ්කතාකඞ්ක්කතාශ්චෛව කුන්දෑපුත්‍රාස්තථෛව ච

වායසා බ්‍රහ්මපුත්‍රාශ්ච බලිං ගෘහ්ණන්තු ඕන්නමඃ''

(Daivajñakāmadhenuḥ, 1906, xxvi.8)

මෙවැනි මන්ත්‍ර ගණනාවක් දෛවඥකාමධේනුවේ ඇතුළත් වී තිබේ.

5.2 රචනා ශෛලිය සහ කවිත්වය

අනවමදර්ශී මා හිමිපාණන් වහන්සේ විසින් දෛවඥකාමධේනුව රචනා කිරීමේදී මධ්‍යකාලීන යුගයේ සම්භාව්‍ය භාරතීය ජ්‍යෝතිෂශාස්ත්‍රඥයන් විසින් භාවිත කරන ලද විදග්ධ

භාෂා ශෛලිය භාවිත කරනු ලැබ ඇති බව පෙනේ. මෙම කෘතිය ම උන්වහන්සේ සංස්කෘත භාෂා ශාස්ත්‍රයේ සහ ව්‍යාකරණයේ පිරිපුන් දැනුමැත්තකු බවට කදිම සාක්ෂ්‍යයකි. එපමණක් ම නො ව උන්වහන්සේ භාෂාව සුනම්‍ය ලෙස හැසිරවීමෙහි සහ අර්ථය ලලිතවත් ව ඉදිරිපත් කිරීමෙහිලා සමත්කම් ඇති රචකයකු බැව් ද එයින් ම සනාථ වේ. මේ පිළිබඳ කෙටි විවරණයක් දෙහිගස්පේ පඤ්ඤාසාර හිමියන් විසින් ද සිදු කර තිබේ (Pannasara Sthavira, (no date). pp.219-222).

මාලිනී වෘත්තයෙන් රචිත පහත දැක්වෙන පද්‍යය උන්වහන්සේගේ භාෂා භාවිතයටත් සුලලිත රචනා ශෛලියටත් කදිම නිදර්ශනයකි.

> ''විපුලවිමලමූර්තිඃ කිංශුකාශොකවර්ණඃ
>
> ස්ඵුටරුචිරමයූඛස්තප්තතාම්‍රප්‍රභාවඃ
>
> විචරති යදි මාර්ගාඤ්චොත්තරං මෙදිනීජඃ
>
> ශුභකෘදවනිපානාං හාර්දකෘච්ච ප්‍රජානාම්''
>
> (Daivajñakāmadhenuḥ, 1906, p.34)

(ඉදින් මහත් වූ නිර්මල බවේ මූර්තියක් වූ ද කැල අශෝක මල් මෙන් රතු පැහැති වූ ද පැහැදිලි දීප්තිමත් කාන්ති ඇත්තා වූ ද තවන ලද තඹ මෙන් දිළිසෙන්නා වූ ද කුජ ග්‍රහයා [යම් විටක] උතුරු මාර්ගයෙහි (දිශාවෙහි) හැසිරෙයි ද [එවිට] රජවරුන්ට යහපත ද ජනතාවට සතුට ද ඇතිකරන්නේ ය.)

සමස්ත කෘතියේ ඇති පද්‍ය සංඛ්‍යාවෙන් බහුතරය ශ්ලෝක වෘත්තයෙන් රචනා කර ඇති අතර ආර්යා ගණයේ වෘත්තවලින් රචිත පද්‍ය ද සැලකිය යුතු ප්‍රමාණයක් තැනින් තැන හමුවේ. ක්‍රි.ව. 10වන ශතවර්ෂයට පෙර ජීවත් වූ ජ්‍යෝතිෂ ශාස්ත්‍රඥයන් අතර බෙහෙවින් ජනප්‍රිය වී ඇත්තේ ආර්යා වෘත්තය යි. ඒ බැව් ආර්යභටගේ (ක්‍රි.ව. 5 සියවස) ආර්යභටීය, බ්‍රහ්මගුප්තගේ (ක්‍රි.ව. 7 සියවස) බ්‍රාහ්මස්ඵුටසිද්ධාන්ත, ශ්‍රීධරගේ (ක්‍රි.ව. 8 සියවස) පාටීගණිත, මහාවීරගේ (ක්‍රි.ව. 9 සියවස) ගණිතසාරසංග්‍රහ

වැනි කෘති පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. එහෙත් ක්‍රි.ව. 10වන ශතවර්ෂයට පසු රචිත කෘතිවල ගණඡන්දසට අයත් විවිධ විචිත්‍රවත් වෘත්ත භාවිත වී තිබේ. ශ්‍රීපති (ක්‍රි.ව. 10 සියවස) එහි පුරෝගාමියකු වූ අතර භාස්කාරාචාර්ය (ක්‍රි.ව. 12 සියවස) එය කූටප්‍රාප්තිය කරා ගෙන ගියේ ය. ශ්‍රීපතිගේ ගණිතතිලක සහ සිද්ධාන්තශේඛර වැනි කෘතිත් භාස්කරාචාර්යගේ ලීලාවතී, සිද්ධාන්තශිරෝමණි වැනි කෘතිත් එහිලා නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. දෛවඥකාමධේනුවේ ද මෙම ප්‍රවණතාව මැනවින් දැකිය හැකි ය. ඒ අනුව ගණඡන්දසට අයත් විවිධ වෘත්තවලින් රචිත පද්‍ය ගණනාවක් ද මෙහි දී අපට හමුවේ. මේ චන්ද්‍ර, චන්ද්‍රෝච්ච, කුජ, බුධ, ගුරු, ශුක්‍ර, ශනි, සහ රාහු යන ග්‍රහයන්ට අයත් ධ්‍රැව දැක්වීම සඳහා අනුප්‍රාසය සහිත ව මනහර චම්පකමාලා වෘත්තයෙන් පබඳන ලද පද්‍යයකි.

''තණ්ඩුලලාභී ලීනනරඃ ස්‍යාද්භෛරවපූජා කොශලරාඥඃ

හීරුරරන්ධඃ ශෞණ්ඩගතීනාං ඥානරයාබ්දෙ කාන්තිපතාකා''

(Daivajñakāmadhenuḥ, 1906, i.15)

ඒ ඒ ග්‍රහයන්ට අයත් විකලා පිණ්ඩ දක්වා ඇත්තේ දොධක වෘත්තයෙනි. එය අනුප්‍රාසයෙන් ද අනූන ය.

''දීධිකා ධූලිකා කාරිකා වර්ධනී

වාණිනී ලෙඛිනී ෂඩ්ගුණා භාස්වතා

අෂ්ටනුද් ධානනුද් දානනුද් බීනනුද්

භින්නනුත් කින්නුනා තත්ඵලා ත්‍රික්‍රමාත්''

(Daivajñakāmadhenuḥ, 1906, ii.11)

පහත දැක්වෙන්නේ තොටක වෘත්තයෙන් පබඳන ලද පද්‍යයකි.

''චතුරො හිමමෞලිනගඃ කවයො

මුනිකොටිඛරඃ ඛගවිද්ධ්වනිකා[5]

භයවිද්‍යුරගාන්තමමී ක්‍රමශො

දිනභුක්තිවිලිප්තිගණා විහිතා''

(Daivajñakāmadhenuḥ, 1906, i.30)

(266 (චතුර), 3558 (හිමමෞලි), 30 (නගඃ), 141 (කවයො), 221105 (මුනිකොටිබරඃ), 432 (බගවිත්), 104 (ධ්වනිකා), 414 (භයවිත්) [යන මේවා] රාහු අන්ත කොට ඇති ග්‍රහයන්ට පිළිවෙළින් [යොදන්නේ ය]. [එහි ඵලය] දිනභුක්ති විනාඩිකා සමූහයෝ වෙත්.)

පහත දක්වා ඇත්තේ දෛවඥකාමධේනු කතුවරයාගේ විවිධ විචිත්‍ර වෘත්ත භාවිතය සඳහා නිදසුන් කිහිපයකි.

වෘත්තය	නිදසුන් පද්‍ය (Daivajñakāmadhenuḥ, 1906)
චම්පකමාලා	i.15
ශාලිනී	x.10.20
තොටක	i.30, iii.5
දොධක	ii.11
ද්‍රැතවිලම්භිත	ii.2.7
කලහංසා	vi.65
ඉන්ද්‍රවජ්‍රා	iii.1.30-31
උපෙන්ද්‍රවජ්‍රා	ix.6.8
උපජාති	ii.67, 68, iii.1.29
වසන්තතිලකා	ii.2.9, iii.1.15-25, vii.31, vii.33, x.6.5, x.10.27
මාලිනී	iv.6.3, vii.36
මන්දාක්‍රාන්තා	v.48, 63, vii.34, ix.3.24
ශාර්දූලවික්‍රීඩිත	iii.1.26-28, v.2.1
ශ්‍රග්ධරා	i.17, iv.6.1

3 වගුව

අර්ථය සංක්ෂේප කොට ඉදිරිපත් කරන්නා සේ සංඛ්‍යා ගණනාවක් ඉතා කෙටි පද්‍යයක බහා ඉදිරිපත් කරන අයුරු

මනස්කාන්ත ය. පහත දැක්වෙන්නේ අස්විදාදි නක්‍ෂත්‍ර 27ට අයත් තරු සංඛ්‍යාව දක්වා ඇති පද්‍ය ද්වය යි.

''ශිඛිගුණරසෙන්ද්‍රියානලශශිවිෂයගුර්තුපඤ්චවසු පක්‍ෂාඃ

විෂයෛකචන්ද්‍රභූතාර්ණවාග්නිරුද්‍රශ්විවසුදහනාඃ

භූතශතපක්‍ෂවසවො ද්වාත්‍රිංශච්චෙති තාරකාමානම්

ක්‍රමශොශ්විනාද්‍යාදීනාං වරාහමිහිරෙණ නිර්දිෂ්ටම්''

(Daivajñakāmadhenuḥ, 1906, iii.11-12)

(අස්විදාදි [සත්විසි] නැකැත්වලට අයත් තරු සංඛ්‍යා පිළිවෙළින් 3, 3, 6, 5, 3, 1, 5, 3, 6, 5, 8, 2, 5, 1, 1, 5, 4, 3, 11, 2, 8, 3, 5, 100, 2, 8, 32 යයි වරාහමිහිරාචාර්යවරයා විසින් දක්වන ලදි.)

මෙවැනි ආකෘතික සුන්දරත්වයක් ඇති පද්‍ය රචනා පමණක් නො ව අර්ථ වශයෙන් රසවත් වූ පද්‍ය ද දෛවඥකාමධේනුවේදී අපට හමුවේ. එහෙත් කාව්‍යයකදී මෙන් විවිධ අලංකාරාදිය යෝජනය කරමින් රචිත සංකීර්ණ පද්‍ය මෙහි හමු නො වේ. උපමා-රූපකාදි සීමිත අලංකාර ප්‍රමාණයක් පමණක් කතුවරයා විසින් මෙහි යෝජනය කරනු ලැබ තිබේ. උපමාලංකාරයේ භාවිතය පිළිබඳ නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

''යෙ දොෂාස්තිථිනක්‍ෂත්‍රවාරරාශිග්‍රහොද්භවාඃ

තෙ ජීවදෘෂ්ටාඃ ක්‍ෂීයන්තෙ මුනිනා මාරසෛන්‍යවත්''

(Daivajñakāmadhenuḥ, 1906, xxii.90)

(තිථි, නක්‍ෂත්‍ර, වාර, රාශි, [සහ] ග්‍රහ [යන මොවුන්ගෙන්] හටගත් යම් දෝෂයෝ වෙත් ද ඒ [දෝෂ] ගුරුගේ දෘෂ්ටියට හසු වූයේ භාග්‍යවතුන් වහන්සේ විසින් දක්නා ලද මාරසේනාව මෙන් දුරු වී යන්නේ ය.)

තිථි, නක්‍ෂත්‍රාදීන්ගෙන් ඇතිවන උවදුරු දුරු කිරීමෙහිලා ගුරු සතු ව පවතින බලය කියාපෑම සඳහා කතුවරයා බුදුරදුන් උපමාවට ගෙන තිබේ. ජ්‍යෝතිෂ ඥානය වෛදික සම්ප්‍රදාය

තුළ හැදී වැඩුණක් වුව ද එය ඉදිරිපත් කිරීමේදී කතුවරයාගේ බෞද්ධාගමික නැඹුරුව මතුවන අයුරු මින් පෙනේ.

''කලහාය භවෙද්භානු රජතාදර්ශවන්මධෞ

භයාය සර්මෙ රක්තාභඃ ශ්වෙතො වර්ෂස්‍ය දෘෂ්ටිකෘත්''
(Daivajñakāmadhenuḥ, 1906, ii.2.2)

(සූර්යයා බක් (මධු) මාසයෙහිදී රිදී කණ්ණාඩියක් මෙන් වේ නම් එය කලකෝලාහල පිණිස වන්නේ ය. නිදාඝ කාලයෙහි රත් පැහැ ඇත්තේ නම් භය සඳහා වන්නේ ය. වර්ෂා කාලයේ සුදු පාටින් යුතු වන්නේ වැසි ඇතිකරන්නේ ය.)

''ශිරීෂපුෂ්පවත් සද්‍යො වෘෂ්ටිකාලෙෂු වෘෂ්ටිකෘත්

ධත්තෙ චන්ද්‍රකපිච්ඡාභො ද්වාදශාබ්දමවග්‍රහම්''
(Daivajñakāmadhenuḥ, 1906, ii.2.4)

(වර්ෂා කාලයෙහි මහරි පුෂ්ප බඳු පැහැ ඇත්තේ නම් එකෙණෙහි වැසි ඇතිකරන්නේ ය. මොනර පිල් ඇසක කාන්තිය ඇත්තේ නම් දොළොස් වසක් වැසි නැති වේ.)

ලග්න ඵලාඵලාදිය දක්වමින් ඉදිරිපත් කරන පහත පද්‍යයේ අරමුණ ස්වභාව සෞන්දර්යය වර්ණනා කිරීම නො වුණ ද එය ස්වභාවෝක්ත්‍යලංකාරයෙන් රසවත් වූ පද්‍යයක් වශයෙන් ද ගිණිය හැකි ය.

''ස්‍රවන්ති සරිතඃ ස්වල්පජීමූතානාතිවාරිදාඃ

පෘථිවී ශස්‍යවිරලා ව්‍යාලදංෂ්ට්‍රිසමාකුලා''
(Daivajñakāmadhenuḥ, 1906, i.1)

(ගංගා ගලා යයි. කුඩා වළාකුළු බොහෝ ජලය දෙන්නෝ නො වෙති. භූමිය අස්වැන්නෙන් හීන වේ. එය චණ්ඩ මෘගයන්ගෙන් ගැවසුණේ වේ.)

අනවමදර්ශී මා හිමියෝ ස්වකීය කෘතිය ආරම්භ කරනුයේ ද මංගලාචරණය වශයෙන් උචිත රූපකයක් සහිත පද්‍යයක්

යොදමිනි. එහි දී උන්වහන්සේ බුදුරදුන්ගේ ප්‍රඥාව දකිනුයේ මාණික්‍යමය කැඩපතක් වශයෙනි.

''ප්‍රතිඵලන්ති ජගන්ති සමන්තතො
මහති යද්ධිෂණාමණිදර්පණෙ
ස භගවාන් මුනිරීහිතසිද්ධයෙ
හෘදි චිරං මම ගන්ධකුටීයතාම්''
(Daivajñakāmadhenuḥ, 1906, i.1)

(යම් කිසි කෙනකුගේ මහත් වූ ප්‍රඥා නමැති මණිදර්පණයෙහි හාත්පස ලෝකය පිළිබිඹු වී පෙනේ ද ඒ භාග්‍යවත් මුනිතුමා [මගේ] අපේක්ෂා සාධනය සඳහා මගේ හදවත ගඳකිළියක් බවට පත්කරත්වා.)

මෙවැනි අර්ථාලංකාර පමණක් නො ව ඇතැම් තැනක ශබ්දාලංකාර ද දෛවඥකාමධේනුවේ යෙදී තිබේ. පහත දැක්වෙන්නේ එවැනි උදාහරණ කිහිපයකි.

''ශිෂ්ටමිෂ්ටදිනප්‍රොක්තං යුගොදයදිනාදිනම්
යුගොදයදිනෙශඃ ස්‍යාද්‍යුගමානෙන වා හතෙ''
(Daivajñakāmadhenuḥ, 1906, i.9)

''අකලුෂාංශුජටිල ස්ඵුටමූර්ත්තිඃ
කුමුදකුන්දකුසුමස්ඵටිකාභඃ
සුරගුරුඃ සකලලොකවිවෘද්ධිං
විතනුතෙ යදි පරෛරවිනෂ්ටඃ''
(Daivajñakāmadhenuḥ, 1906, vi.65)

මේ අනුව බැලූ කල දෛවඥකාමධේනුව තාක්ෂණික කරුණු අළලා කැරුණු රචනාවක් වුව ද එහි සාහිත්‍යමය අගයක් ද පවතින බැව් ප්‍රකාශ කළ හැකි ය.

5.3 දෛවඥකාමධේනුවේ මූලාශ්‍රයයන්

ඉහත ද සඳහන් කරන ලද පරිදි භාරත සභ්‍යත්වය, විද්‍යා-තාක්ෂණය මෙන් ම භාෂා සාහිත්‍යය ද සමාසන්න සහ සමාසන්න නො වූ සංස්කෘතීන් සහ ජනවර්ගයා විෂයෙහි බලපෑම් සහගත වූ බැව් ද ශ්‍රී ලංකාව එහි ව්‍යාතිරේකයක් නොවන බැව් ද පැහැදිලි ය. එහෙයින් ම ලක්දිව රචිත අත්‍යල්ප ජ්‍යෝතිෂ සාහිත්‍යය ද එම ආභාසයෙන් තොර වූයේ නො වේ. මේ නිසා අනවදර්ශී මා හිමියන් විසින් රචනා කරන ලද දෛවඥකාමධේනුව ද මුළුමනින් ම භාරතීය ජ්‍යෝතිෂ මූලාශ්‍රයයන් මත රඳා පවතින බැව් රහසක් නො වේ (Pannasara Sthavira, (no date), p.26).

අනවමදර්ශී හිමියන් පූර්වාචාර්යවරුන් සිව්දෙනකු නාමිකව ම ස්වකීය මූලාශ්‍රයයන් වශයෙන් දක්වා තිබේ. ඒ වරාහමිහිර (Daivajñakāmadhenuḥ, 1906, i.4, xiv.1), භෝජරාජ (Daivajñakāmadhenuḥ, 1906, xi.1), පරාශර (Daivajñakāmadhenuḥ, 1906, xx.140), සහ වශිෂ්ට (Daivajñakāmadhenuḥ, 1906, xxi.1) යන ආචාර්යවරු ය (Pannasara Sthavira, (no date). pp.218-219). මේ නම් සඳහන් කරමින් කර්තෘවරයා සිහිපත් කරනු ඇත්තේ වරාහමිහිරගේ බෘහජ්ජාතකය, පරාශරගේ හෝරාශාස්ත්‍රය ආදිය විය යුතු යැයි පඤ්ඤාසාර හිමියෝ කියති (Pannasara Sthavira, (no date). p.219). දෛවඥකාමධේනු කතුවරයා දක්වන පරිදි ග්‍රහගෝචරය විවරණය කිරීමේදී වරාහමිහිරත් ආවාහ විවාහ ආදි කරුණු දැක්වීමේ දී පරාශරත් ඔහු විසින් ඇසුරු කරනු ලැබ තිබේ. එමෙන් ම ආදේශ විධාන පිළිබඳ සාකච්ඡාවේදී භෝජරාජ ආදීන් විසින් ඉදිරිපත් කරන ලද අදහස්වල සාරය පමණක් ද මංගල විධාන ඉදිරිපත් කිරීමේ දී වශිෂ්ට ආදි පූර්වාචාර්යන්ගේ අදහස් ද ගෙන තිබේ. මෙම කෘති ඇසුරු කර තිබීමෙන් ම අනවමදර්ශී හිමියන්ගේ ජ්‍යෝතිෂය පිළිබඳ ප්‍රඥාපාටවය සුවිශද වේ. ග්‍රන්ථාරම්භයේ දී ම කතුවරයා මෙසේ සඳහන් කරයි.

''ප්‍රාචෛ්‍යර්වරාහමිහිරාදිභිරභ්‍යධායි

ව්‍යාසෙන යච්චරිතමම්බරාගොචරාණාම්

සංභෘත්‍ය තත් ප්‍රථමමත්‍ර විභාවයාමි

සංඛ්‍යානසංස්කරණනිර්ණයයුක්තියුක්තම්''

(Daivajñakāmadhenuḥ, 1906, i.4)

(වරාහමිහිරාදි ප්‍රාචීනයන් විසින් විස්තර සහිත ව ආකාශ වස්තූන්ගේ යම් චරිත ලක්ෂණයක් අවබෝධ කරන ලද්දේ ද පළමු කොට මෙහි දී එය හකුළුවා සංඛ්‍යාන (පරාමිතීන් සහ ගණනය කිරීම්), සංස්කරණ (පිළිවෙත් සහ උපදෙස්), නිර්ණය (තීරණ සහ ඵලාඵල), සහ යුක්තිවලින් (තාර්කික සාධක) යුතු ව ප්‍රකාශ කරමි.)

දහතුන් වන ආධ්‍යායයේ දී දශා විපාක දක්වා ඇතත් වෘහජ්ජාතකයේ මෙන් ම මෙහි ද රාහු සහ කේතු දෙදෙනාට අදාළ දශා ඵල දක්වා නැත. මෙය ද ඇතැම් විට වෘහජ්ජාතකය අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් විය හැකි ය. 27වන පරිච්ඡේදය ලිවීම සඳහා ද පූර්වාචාර්යයන්ගේ ආභාසය තමන්ට ලැබුණු බැව් අනවමදර්ශී හිමියෝ සඳහන් කරති.

''සංක්‍ෂෙපතඃ සමුපභොගදශාවිධානං

වක්‍ෂ්‍යාමි සාම්ප්‍රතමිහ ප්‍රකටීකෘතාස්තු

වාස්තුප්‍රවෙශශයනාසනභූෂණස්ත්‍රී

පට්ටාසිලක්ෂ්මවිධයො මුනිශාස්ත්‍රදෘෂ්ටාඃ''

(Daivajñakāmadhenuḥ, 1906, xxvii.1)

(මුනිවරුන්ගේ ශාස්ත්‍රවල දක්නා ලද නිවාස ඉදිකිරීම (වාස්තු), ගෘහ ප්‍රවේශය (ප්‍රවෙශ), ඇඳවල් ආදිය (ශයන), පුටු ආදිය (ආසන), ආභරණ (භූෂණ), ස්ත්‍රීන් [හා සම්බන්ධ] විධි (ස්ත්‍රී), ශීර්ෂ පළඳනා සහ කඩු දැරීම් (පට්ටාසිලක්ෂ්ම) හා සම්බන්ධ විධි [යන මේවා] ප්‍රකට වූවෝ ද දැන් මම මෙහි දී [ඒ] උපභෝග වස්තු පිළිබඳ ක්‍රමය කෙටියෙන් කියන්නෙමි.)

තව ද, දෛවඥකාමධේනු කතුවරයා සාරාර්ථ සංග්‍රහය ඇසුරු කර තිබෙන බව ඇතැම් ප්‍රයෝගවලින් පැහැදිලි වන බව ජී.එස්.බී. සේනානායක කියයි (සේනානායක, 1998 පි.21).

5.4 දෛවඥකාමධේනුවේ සංස්කරණ සහ පරිවර්තන

දෛවඥකාමධේනුවේ අන්තර්ගතය, එහි මූලාශ්‍රයයන්, ජ්‍යොතිෂශාස්ත්‍රය විෂයෙහි එහි දායකත්වය, එය පශ්චාත්කාලීන සාහිත්‍යය හා/හෝ ලාංකේය ජන සමාජය කෙරෙහි කළ බලපෑම ආදිය පිළිබඳ මෙතෙක් විධිමත් පර්යේෂණයක් සිදු වී නැත. කෘතියේ වැදගත්කම පිළිබඳ සැලකිල්ලට ගත් විට ඊට ලැබිය යුතු නිසි අවධානය මේ දක්වා යොමු වී නො තිබීම කනගාටුවට කරුණකි. එසේ වුව ද සංස්කරණ සහ පරිවර්තන කිහිපයක් පමණක් හෝ ප්‍රකාශයට පත්වී තිබීම තරමක සතුටුදායක තත්ත්වයකි.

සම්පූර්ණ කෘතියට නොවෙතත් දෛවඥකාමධේනුවේ එකොළොස්වන අධ්‍යායයේ පටන් පසළොස්වන අධ්‍යායයේ 51 වැනි පද්‍යය දක්වා වූ පද්‍ය 575කට පමණ ඒ. ජේ. වික්‍රමසිංහ විසින් පදගතාර්ථ සන්නයක් සපයා තිබේ. මෙය මේ සම්බන්ධයෙන් දැනට හමුවන පුරාණතම පළ කිරීම යි. එය ක්‍රි.ව. 1899දී පළ කර තිබේ. ඉන්පසු 1905දී එතුමා විසින් ම කෘතියේ මුල සිට සතරවන අධ්‍යායේ පළමුවන පද්‍යය දක්වා ද සන්නයක් ලියා පළ කරවා ඇත.

ඉන්පසු දොඩන්දූවේ ශෛලබිම්බාරාමයේ සී.ඒ. සීලක්ඛන්ධ හිමි සහ බරණැස සංස්කෘත විද්‍යාලයේ සීතාරාම උපාධ්‍යාය විසින් කරන ලද සංස්කරණය ඉන්දියාවේ බරණැස Messr. Braj B. Das and Co. විසින් 1906 දී බරණැස සංස්කෘත ග්‍රන්ථමාලා (Benares Sanskrit Series) යටතේ ප්‍රකාශයට පත්කර ඇත. මෙම කෘතියේ ද සැලකිය යුතු ප්‍රමාණයක සංස්කරණ දෝෂ පවතින බැව් පෙනීයයි.

ක්‍රි.ව. 1962දී දෛවඥකාමධේනුවේ කොටසක් සිංහලයට පරිවර්තනය කොට පළ කරන ලදි. ඒ.ජේ.පී. පේමරාජ විසින්

කෘතියේ මුල සිට සතරවන අධ්‍යායයේ 25වන ශ්ලෝකය දක්වා භාවසන්නයක් ලියා මෙම පරිවර්තනය පළ කරවනු ලැබ තිබේ. අනතුරු ව ක්‍රි.ව. 1989දී ඩී.ආර්. සෙනෙවිරත්න විසින් සම්පූර්ණ කෘතියට ම සන්නයක් කරන ලදුව මොඩන් පොත් සමාගම විසින් ප්‍රකාශයට පත්කරනු ලැබ තිබේ. එය අවශ්‍ය තැන විස්තරාර්ථකථන ද සහිත ව ඉමහත් පරිශ්‍රමයකින් කරන ලද්දක් වන හෙයින් ඇගයීමට බඳුන් විය යුත්තකි. එහෙත් එහි ද යම් යම් දෝෂ පවතින බවත් ඇතැම් විස්තර තවදුරටත් විවරණය කළ යුතු බවත් පෙනීයයි.

6 සමාලෝචනය

අනුරාධපුර යුගයේ මුල් යුගයේ සිට ම ලක්දිව සාහිත්‍යාවලිය කෙරෙහි සංස්කෘත භාෂාවේත් සාහිත්‍යයේත් ආනුභාවය බල පවත්වන්නට වූ බැව් ඉහතදී සාකච්ඡා කරන ලදි. එම බලපෑමේ උච්චතම අවස්ථාව පොළොන්නරු යුගයේ දී දක්නට ලැබෙන අතර ඉන්පසු ද එහි බලපෑම ඒ ප්‍රමාණයෙන් ම නො වුණත් විවිධ මට්ටමින් සිදු වී ඇති අයුරු පෙනේ. මේ තත්ත්වය දඹදෙණි යුගයේ දී ද නො වෙනස් ව පැවති බැව් එකල ලියැවුණු ග්‍රන්ථ සමුදායෙන් පැහැදිලි වේ. මේ යුගයේ දී බොහෝ කෘති සිංහල භාෂාවෙන් රචනා වූ නමුත් පාලි සහ සංස්කෘත කෘති ඒවාට සාපේක්ෂ ව සුළු වශයෙන් නිර්මාණය වී තිබේ. ඒ අතුරින් ද අතිශය අවම ප්‍රමාණයක් ලැබෙනුයේ සංස්කෘත ග්‍රන්ථ යි. ඉන් වැදගත් ම කෘතිය ලෙස සැලකිය හැක්කේ අනවමදර්ශී මා හිමියන්ගේ දෛවඥකාමධේනුව යි.

භාරතීය ජ්‍යෝතිෂයේ සංහිතා සහ හෝරා යන ස්කන්ධ ද්වයට ම අදාළ කරුණු ඇතුළත් කරමින් රචනා කර ඇති මෙම කෘතිය භාරතීය ජ්‍යෝතිර්ග්‍රන්ථවල ආභාසය ලබමින් රචනා කරන ලද්දක් බව කෘතියේ ම සඳහන් කර තිබේ. එහි කතුවරයා සුනිශිත සංස්කෘත භාෂා-ශාස්ත්‍ර ඥානයකින් හෙබි අයකු මෙන් ම ජ්‍යෝතිෂයෙහි විශාරදයකු ද බවට කෘතිය සාක්ෂ්‍ය දරයි. විවිධ මනහර වෘත්තවලින් රචනා කර ඇති මෙම කෘතිය සුවිශාල

ග්‍රන්ථයකි. කතුවරයාගේ රචනා ශෛලිය විමසා බැලීමේදී පෙනීයන්නේ කතුවරයා කවිතාවෙන් යුතු අයකු බව යි. ලක්දිව ජ්‍යෝතිෂශාස්ත්‍රයේ වර්ධනය සහ එහි භාවිතයේ ඉතිහාසය පිළිබඳ ව හදාරන්නකුට මෙය හස්තසාර ග්‍රන්ථයකි. එහෙයින් මේ කෘතිය පිළිබඳ විධිමත් පර්යේෂණයක් සිදු වන්නේ නම් අතිශය වැදගත් විය හැකි ය.

7 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ප්‍රාථමික මූලාශ්‍රය

අමාවතුර. (1952) සංස්. සෝරත හිමි, වැලිවිටියේ. වැල්ලම්පිටියඃ නවජීවන මුද්‍රණාලය.

දෛවඥකාමධේනු. (1989) පරි. සෙනෙවිරත්න, ඩී. ආර්. නුගේගොඩඃ මොඩන් පොත් සමාගම.

පපඤ්චසූදනී, පළමු වෙළුම. (2014) සංස්. ධම්මකිත්ති සිරි ධම්මානන්ද නා හිමි. හේවාවිතාරණ ග්‍රන්ථමාලා.

මහාවංසො. (1959) සංස්. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

රසවාහිනී, දුතියො භාගො. (බු.ව. 2464) පරි. සරණතිස්ස හිමි. ජිනාලංකාර යන්ත්‍රාලය.

සන්න සහිත විශුද්ධිමාර්ගය. (1949) සංස්. සද්ධාතිස්ස හිමි, බෙන්තර. කළුතරඃ විද්‍යාතිලක යන්ත්‍රාලය.

සමන්තකූටවර්ණනාව. (බු.ව. 2433) පරි. ශ්‍රී සිද්ධාර්ථ හිමි, වලානේ සහ ශ්‍රී ඥානේශ්වර මහගොඩ සාමි. රාජකීය මුද්‍රණාලය.

සුබොධාලංකාර. (1937) පරි. ලංකානන්ද හිමි, ලබුගම. හොරණඃ විද්‍යාශේඛර යන්ත්‍රාලය.

Daivajñakāmadhenuḥ' (1906) ed. Seelakkhandha, Rev. C.A. Benares: Braj B. Das & Co.

*Epigraphia Zeylanic*a, Vol. I. (1994) ed. & trans. Wickremasinghe, Don Martino De Silva. New Delhi: Asian Educational Services.

Epigraphia Zeylanica, Vol.II. (1994) ed. & trans. Wickremasinghe, Don Martino De Silva. New Delhi: Asian Educational Services.

Epigraphia Zeylanica, Vol. III. (1994) ed. & trans. Wickremasinghe, Don Martino De Silva and H.W. Codrington. New Delhi: Asian Educational Services.

Epigraphia Zeylanica, Vol. IV. (1994) ed. & trans. Codrington, H.W. and S. Paranavitana. New Delhi: Asian Educational Services.

Epigraphia Zeylanica, Vol. V. (1994) ed. & trans. Paranavitana, S. Colombo: Department of Archeaology.

Hatthavavagallavihāravaṃsa. (1956) ed. Godakumbra, C. E. London: The Pali Text Society.

ද්විතීයක මූලාශ්‍රය

කැකුළාවල, එස්.එල්. (1965) ''සංස්කෘත සාහිත්‍යය'', ලියනගමගේ, අමරදාස, සහ රණවීර ගුණවර්ධන, අනුරාධපුර යුගය. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය.

කුලසූරිය, ආනන්ද. (1963) සිංහල සාහිත්‍යය 2. මහරගමඃ සීමාසහිත සමන් ප්‍රකාශකයෝ.

ගුණවර්ධන, ඩබ්.එෆ්. (1959) සිද්ධාන්ත පරීක්ෂණය. ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

ගුරුගේ, ආනන්ද ඩබ්ලිව්.පී. (1998) ''සංස්කෘත භාෂා සාහිත්‍යය, ව්‍යාප්තිය හා ආභාසය'', අපේ සංස්කෘතික උරුමය, ද්විතීය කාණ්ඩය, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය.

චන්ද්විමල, කලුන්දෑවේ. (2012) ශ්‍රී ලාංකේය සංස්කෘත අභිලේඛන සහ සමකාලීන සමාජය. වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

ජයතිලක, ඩී.බී. (1955) කතිකාවත් සඟරා, කැලණියඃ විද්‍යාලංකාර මුද්‍රණාලය.

තිලකසිරි, සිරි. (2002) සාහිත්‍ය අටුවාව - දඹදෙණි සාහිත්‍ය. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ, විමල් ජී. (2003) ''සිදත් සඟරාව පිළිබඳ විචාරපූර්වක විමර්ශනයක්'', වැලමිටියාවේ ශ්‍රී කුසලධම්ම ප්‍රශස්ති. කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ලියනගමගේ, අමරදාස. (1989) මධ්‍ය කාලීන ලංකා ඉතිහාසය. කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ලියනගමගේ, අමරදාස. (2007) ''දේශපාලන ඉතිහාසයඃ දඹදෙණි රාජධානි සමය'', ශ්‍රී ලංකාවේ ඉතිහාසය. බත්තරමුල්ලඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

සේනානායක, ජී.එස්.බී. (1998) ශ්‍රී ලංකාවේ සංස්කෘත සාහිත්‍යය. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

Pai, Venkateswara et al. (2016) “An Overview of the Vākya Method of Computing the Longitudes of the Sun and Moon”, in History of Indian Astronomy: A Source Book. Bombay: Indian Institute of Technology Bombay and Tata Institue of Fundemental Research.

Pannasara Sthavira, Dehigaspe. (no date) Sanskrit Literature. Colombo: Wimaladharma Hewawitarane Esqr.

Paranavitana, S. (1947) “The Subject of Sigiri Paintings”, in India Antiqua, Leyden: E.J. Brill.

Sriram, M.S. (2015) “Vākya System of Astronomy”, in Handbook of Archaeaastronomy and Ethnoastronomy. New York: Springer Science+Business Media.

Subbarayappa, B.V. (1985) Sarma, K.V., Indian Astronomy: A Source Book. Bombay: Nehru Centre.

සටහන්

1. ''පීනපයොධරභාරා ලලිතසාරරචිතතනුමධ්‍යා

   නීලෙන්දීවරෙණ නයනා කෙ'යං මනොරමා රාමා'' (Paranavitana, 1947, p.264)

2. ''ගණ්ඩස්ථලීලුඨිතදානමසීනිෂෙක

   භ්‍රාන්තොන්නදද්භ්‍රමරමණ්ඩලඩිණ්ඩිමෙන

   ක්‍රොධොෂ්මණාභිදවතා ධනපාලකෙන

   පාදද්වයෙ ප්‍රණතමායසීධෘතාංකුශෙ තෙ'' (අමාවතුර, 1952, පි.141)

3. විස්තර සඳහා බලන්න (කුලසූරිය, 1963, පිටු.196-224).

4. ''විශ්‍රාමද්වීපභූමිර්ග්‍රහචරිතඵලග්‍රන්ථසින්ධූපගානා

   මාදෙශග්‍රන්ථචින්තාතපවිවශධියාං නිර්වෘතස්වර්ගගංගා

   භාස්වද්‍රත්නාවලීයං විවිධවිධිමයාලංකෘතෞ සස්පෘහාණාං

   සන්තුෂ්ටෛය කස්‍ය න ස්‍යාත් සුචිරමනුශ්‍රුතා දෛවවිත් කාමධෙනුඃ

ග්‍රහගණිතවිධානං තත්ඵලං ජාතකාඛ්‍යං

විධිමපි ච නිමිත්තං සත්ක්‍රියාණාං විධානම්

ස්පෘහයිතුරලමෙකෙ නෛව ශාස්ත්‍රෙණ වෙත්තුං

පරිලඝු ලිඛිතෙයං දෛවවිත් කාමධෙනුඃ'' (Daivajñakāmadhenuḥ, 1906, p.270)

5. මෙ පදය Daivajñakāmadhenuḥ, 1906 හි යෙදී ඇත්තේ ධ්වනිනා යනුවෙනි. එහෙත් දෛවඥකාමධේනු, 1989 හි එය ධ්වනිකා යනුවෙන් යෙදී ඇත. මෙහි සංඛ්‍යාව 104 බැවින් නිවැරදි පදය ධ්වනිකා විය යුතු ය.